# වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2014

# வருடாந்த செயல் நிறைவேற்றுகை - 2014

# Annual Performance Report- 2014

**නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය**
**சட்டமும் ஒழுங்கும் பற்றியஅமைச்சு**
**Ministry of Law and Order**

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

# 2014



නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය
13 වන මහළ, 'සෙත්සිරිපාය' දෙවන අදියර,
බත්තරමුල්ල.
දුරකථන අංකය : 011 – 2186101 - 4
ෆැක්ස් අංකය : 011 – 2186109
විද්‍යුත් තැපැල : info@lawandorder.lk
වෙබ් පිටුව : www.lawandorder.lk

# පටුන

පිටු අංකය


| | |
|---|---|
| 1. හැඳින්වීම | 4 |
| 2. අමාත්‍යාංශයේ දැක්ම, මෙහෙවර, අරමුණු සහ කාර්යයන් | 5 |
| 3. අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය | 6 |
| 4. 2014 වර්ෂයේ අමාත්‍යාංශයේ සමස්ථ කාර්ය සාධනය | 7-13 |
| 5. මූල්‍ය ප්‍රගති සාරාංශය | 14 |
| 6. සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය - 2014 | 15-19 |
| 7. කාර්ය මණ්ඩල කාර්ය සාධනය | 20-27 |
| 8. ආයතනිකමය ව්‍යුහය සංවර්ධනය | 28-30 |
| 9. නෛතික ප්‍රතිපාදන සවිබල ගැන්වීම | 31-32 |
| 10. වෙනත් විශේෂ කාර්යයන් | 33-35 |
| 11. ප්‍රගති සාරාංශය | 36 |

# 01. හැඳින්වීම

රටක් සංවර්ධනය වීම සඳහා එරට ආර්ථික සංවර්ධනය මෙන්ම සමාජීය සංවර්ධනයද සිදු විය යුතුය. සමාජීය සංවර්ධන ඉලක්කවල උපරිමයට ළඟා වීම සඳහා නීති ගරුක, ගුණ ගරුක පුරවැසියන්ගෙන් යුත් සමාජයක් බිහිකිරීම කළ යුතු වේ. ඒතුළින් තිරසාර සංවර්ධන ඉලක්ක ලඟා කර ගැනීම සඳහා බාහිර මෙන්ම අභ්‍යන්තර වශයෙන් සාමකාමී වටපිටාවක් නිර්මාණය කළ යුතුය.

තිරසාර සංවර්ධනයක් සඳහා රටක් මෙහෙයවීමේදීත් ලඟා කර ගත් සංවර්ධනය පවත්වාගෙන යාමේදීත් තිරසාර සාමයක් රට තුළ පැවතීම අත්‍යවශ්‍ය වූ සාධකයකි. “සංවර්ධනයේ ප්‍රධාන අවිය වන්නේ සාමයයි” යන නෙල්සන් මැන්ඩලාගේ ප්‍රකාශය අනුවද රටක සංවර්ධනයට තිරසාර සාමයක් පැවතීම අත්‍යවශ්‍ය කරුණක් බව පෙනී යයි.

මේ අනුව නීතිය හා සාමය සුරක්ෂිත කිරීමට වගකීම පැවරෙන අප අමාත්‍යාංශයට ඉතා ඉහළ වගකීමක් පැවරී තිබේ.

ශ්‍රී ලංකාවේ තිරසාර සාමය පවත්වා ගැනීමට එරෙහිව පැවති ප්‍රධාන බාධකයක් වූයේ 30 වසරක් පුරා ශ්‍රී ලංකා සමාජ ආර්ථික දේහය වසා පැතිර පැවති කුරිරු ත්‍රස්තවාදයයි. නීතිය හා සාමය ස්ථාපිත කිරීම සඳහා වූ සාම වැඩපිළිවෙල යටතේ ක්‍රියාත්මක වූ මානුෂීය මෙහෙයුම මඟින් උතුරු නැගෙනහිර ඇතුළු සමස්ත දේශයම ත්‍රස්තවාදයෙන් මුදා ගෙන සාමය උදා කර ගන්නා ලදී.

එතෙක් ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාව, මහජන සාමය ආරක්ෂා කිරීම පැවරී තිබූ රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයට ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාව සැලසීමේ වගකීම එලෙසින්ම තවදුරටත් තබමින් පශ්චාත් යුධ සමයක් තුළ මතුවිය හැකි අපරාධ, ප්‍රචණ්ඩත්වය, හිංසනය හා සමාජ විරෝධී ක්‍රියාවන් මැඩපවත්වමින් රටේ සාමය ස්ථාපිත කිරීමේ ක්‍රියාවලිය කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීමේ අරමුණින් 2013.08.16 දිනැති 1823/07 අංක දරණ අති විශේෂ ගැසට් නිවේදනය මඟින් එවකට නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය ස්ථාපිත කරන ලදී.

ශ්‍රී ලංකා පොලීසිය හා විශේෂ කාර්ය බලකාය, මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන වන අතර එම ආයතන සඳහා ප්‍රතිපත්තිමය මඟපෙන්වීම, ක්‍රියාකාරීත්වය අධීක්ෂණය හා කාර්යසාධනය අගැයීම අමාත්‍යාංශ විෂය පථයට අයත් වේ.

ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා මහජන ආරක්ෂාව නීතිය හා සාමය පවත්වාගෙන යාමට අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදන වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම මඟින් මහජන සේවාවන් කාර්යක්ෂම හා මහජන හිතකාමී අන්දමින් පවත්වාගෙන යෑම අමාත්‍යාංශයේ වගකීම වේ.

මහජන සාමය ඇති කිරීමෙහිලා අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන 2014 වර්ෂය තුළ සැලසුම් කරන ලද වැඩසටහන් හා ව්‍යාපෘති කෙතෙක් දුරට සාර්ථකව ඉටු කර ගත්තේද යන්න විස්තරාත්මකව හා සංසන්දනාත්මකව මෙම වාර්තාව මඟින් ඉදිරිපත් කරනු ලබයි.

## 02. අමාත්‍යාංශයේ දැක්ම, මෙහෙවර, අරමුණු සහ කාර්යයන්

### අමාත්‍යාංශයේ දැක්ම

" විනය ගරුක රටක් - නීතිගරුක සමාජයක් "

### අමාත්‍යාංශයේ මෙහෙවර

"මහජන ආරක්ෂාව,නීතිය හා සාමය පවත්වාගෙන යාමට අවශ්‍ය ප්‍රතිපත්ති උපාය මාර්ග සම්පාදනය, ක්‍රියාත්මක කිරීම සහ අගැයීම"

### අමාත්‍යාංශයේ අරමුණු

(i) නීතිය හා සාමය පවත්වාගෙන යාමට අවශ්‍ය ප්‍රතිපත්ති, උපාය මාර්ග වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම.

(ii) සේවාවන් කාර්යක්ෂම හා මහජන හිතකාමී අන්දමින් පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

(iii) භෞතික හා මානව සම්පත් සංවර්ධනය තුළින් සේවා, සේවාලාභී තෘප්තිය ඉහළ නැංවීම.

### අමාත්‍යාංශයේ කාර්යයන්

(i) මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පවත්වාගෙන යාම හා සංවර්ධනය කිරීමට අදාළ ප්‍රතිපත්ති වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම.

(ii) මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පවත්වා ගෙන යාමට අදාල මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අන්දමින් පවත්වාගෙන යාම.

(iii) නවීන තාක්ෂණික කළමනාකරණ ක්‍රම සහ විධි අමාත්‍යාංශ කාර්යභාරය ඉටුකිරීමේදී යොදාගනිමින් නාස්තිය හා දූෂණය පිටු දැකීම.


(iv) නීතිය හා සාමය පවත්වාගෙන යාම.

(v) මහජන ආරක්ෂාව සහ දේපල ආරක්ෂාව සැලසෙන පරිදි රථ වාහන ගමනාගමනය පාලනය කිරීම.

(vi) පොලිස් දෙපාර්තමේන්තුව හා පොලිස් දෙපාර්තමේන්තුවට පවරා ඇති කාර්යයන් අධීක්ෂණය හා මෙහෙයවීම.

(vii) මහජන ආරක්ෂාව හා සාමය පවත්වාගෙන යාමට අවශ්‍ය භෞතික හා මානව සම්පත් සංවර්ධනය.

## 03. අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය



# 04. 2014 වර්ෂයේ අමාත්‍යාංශයේ සමස්ථ කාර්ය සාධනය

මහජන සාමය පවත්වාගෙන යාම රට තුළ නීතිය ස්ථාපිත කිරීම යන කාර්යයභාරයෙහි සුවිශේෂීකම නිසාම එම වගකීම දැරීම සඳහාම වූ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය පිහිටුවන ලදී.

අමාත්‍යාංශය ස්ථාපිත කිරීමෙන් පසු කාල සීමාව තුළ ක්‍රියාත්මක කළ සුවිශේෂී වූ උපාය මාර්ගික ප්‍රවේශයක් සහිත වැඩසටහන් හා ව්‍යාපෘති නිසා රට තුළ නීතිය හා සාමය ස්ථාපිත වීම ක්‍රමයෙන් වර්ධනය වී ඇත. මෙම වර්ධනය ප්‍රධාන වශයෙන් රටේ සාමාන්‍ය ජන ජීවිතයේ වර්ධනයට බලපා ඇති ආකාරය පහත කාර්යසාධන දර්ශක ආශ්‍රයෙන් පෙන්නුම් කළ හැකිය.

i. අපරාධ වාර්තාවීම් හා විසඳීම්
ii. කාන්තාවන්ට හා ළමයින්ට එරෙහිව සිදුවන අපරාධ
iii. රථ වාහන අනතුරු
iv. සුරාබදු සහ මත්ද්‍රව්‍ය සම්බන්ධ අපරාධ
v. දූෂණ මර්දන සහ වැටලීම්

## 4.1 අපරාධ වාර්තාවීම් හා විසඳීම්

අමාත්‍යාංශ කාර්ය සාධනය පිළිබිඹු කරන ප්‍රධාන දර්ශකයක් වන්නේ රට තුළ අපරාධ වාර්තාවීම් නිරපේක්ෂ ප්‍රමාණය හා වාර්තා වූ අපරාධ විසඳීම් සාපේක්ෂ අගයයි. අමාත්‍යාංශයේ ප්‍රතිපත්තිමය හා උපාය මාර්ගික මහපෙන්වීම යටතේ පොලිස් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලැබූ වැඩසටහන් හා ව්‍යාපෘති හේතුවෙන් 2012 – 2014 කාල සීමාව තුළ අපරාධ වාර්තාවීම් ප්‍රමාණය හා අපරාධ විසඳීම් සම්බන්ධයෙන් සිදුව ඇති වෙනස්කම් පහත වගුවෙන් පෙන්නුම් කරයි.

**අපරාධ වර්ග අනුව වාර්තා වීම් සහ විසඳීම්**

සංඛ්‍යා වගුව - **01**

| අපරාධවර්ගය | 2012 | | 2013 | | 2014 | |
|---|---|---|---|---|---|---|
| | වාර්තාවීම් | විසඳීම් | වාර්තාවීම් | විසඳීම් | වාර්තාවීම් | විසඳීම් |
| බල අපරාධ | 57,162 | 30,976 | 55,349 | 32,791 | 50,962 | 29,396 |
| සුළු වැරදි - පුද්ගලයින්ට එරෙහි | 42,606 | 29,129 | 45,282 | 33,094 | 42,368 | 30,561 |
| සුළු වැරදි - දේපලවලට එරෙහි | 23,025 | 13,256 | 26,138 | 15,703 | 21,827 | 11,691 |
| සුළු පැමිණිලි | 1,046,143 | 1,041,777 | 1,046,024 | 1,044,465 | 1,065,648 | 1,063,413 |
| එකතුව | **1,168,936** | **1,115,138** | **1,172,793** | **1,126,053** | **1,180,805** | **1,135,061** |

*මූලාශ්‍රය - ශ්‍රී ලංකා පොලීසිය*

සටහන :

අපරාධ විසඳීම යනු : බල අපරාධ - සැකකරුවන් අත්අඩංගුවට ගත් ප්‍රමාණය වේ. සුළු වැරදි හා සුළු පැමිණිලි - ශ්‍රී ලංකා පොලීසිය මඟින් හෝ සමථ මණ්ඩලයට යොමු කොට හෝ නඩු පැවරීමෙන් විසඳුම් ලබා දී අවසන් කළ ප්‍රමාණය වේ.

අපරාධ වල ස්වභාවය මත වර්ගීකරණය කරන ලද අපරාධ වාර්තාවීම් ප්‍රමාණය සමස්ථයක් ලෙස සැලකීමේදී 2013 වර්ෂයේදී සුළු වැරදි වාර්තාවීම් සහ 2014 වර්ෂයේදී සුළු පැමිණිලි වාර්තාවීම් වල සුළු ඉහළ යාම හැරුණු කොට ක්‍රමික අඩුවීමක් පෙන්නුම් කෙරේ.

බල අපරාධ යන්නට අපරාධ වර්ග 21 ක් අයත්වන අතර සුළු වැරදි යටතේ එන පුද්ගලයින්ට එරෙහි සුළු වැරදි සහ දේපල වලට එරෙහි සුළු වැරදි වර්ග පිළිවෙලින් 15 ක් සහ 11 කි. පොලීසියේ සියළු අපරාධ වාර්තාවීම් වලින් 50% ක් තරම් ඉහළ අගයක් ගන්නා සුළු පැමිණිලි වර්ග වශයෙන් ගත් කළ 16 ක් වේ.

බල අපරාධ විසඳීම් ප්‍රතිශතය 2012 වර්ෂයේ 54% සිට 2013 වර්ෂයේ 59% දක්වා 9.3% ක ඉහළ යාමක් වාර්තා කරන අතර 2014 දී එය තවදුරටත් පවත්වාගෙන යමින් වාර්තා වූ අපරාධ ප්‍රමාණයෙන් 58% ක ප්‍රමාණයක් විසඳීමට සමත් වී තිබේ.

බල අපරාධ වාර්තාවීම් වලින් ඉතා ඉහළ අගයක් ගනු ලබන්නේ ගෙවල් බිඳීම්, පාපැදි හා ගවයන් සොරකමත්, වැවිලි ද්‍රව්‍ය ඇතුළු රු.5,000 ට වැඩි දේපල සොරකමත් ය.

2014 වර්ෂයේ වාර්තා වූ පුද්ගලයන්ට එරෙහි සුළු වැරදි විසඳීම් 72% කි. එය 2013 (73%) වර්ෂයට සාපේක්ෂව 1% ක පසුබෑමක් පෙන්නුම් කළද 2012 (68%) වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂය ළගාකරගත් 7% ක විසඳීම් ප්‍රගතිය තවදුරටත් පවත්වාගෙන යාමකි. දේපලවලට එරෙහි සුළු වැරදි විසඳීම් ප්‍රගතිය 2013 වර්ෂයේ විසඳීම් ප්‍රගතිය වන 61% ට සාපේක්ෂව 11% ක අඩුවීමක් පෙන්නුම් කළද වාර්තා වූ ප්‍රමාණයට සාපේක්ෂව 53% ක විසඳීම් ප්‍රමාණයක් පෙන්නුම් කරයි.

බැන තර්ජනය කිරීම, පහරදීම, පවුල් ආරවුල්, ඉඩම් ආරවුල් සහ මුදල් හා භාණ්ඩ පිළිබඳ ආරවුල් සුළු පැමිණිලි වාර්තාවීම් වල ඉහළ අගයක් ගනු ලබයි. 2012,2013,2014 වර්ෂ පිළිවෙලින් ගත් කළ 99.5%, 99.7%,99.6% ක විසඳීම් ප්‍රතිශතයක් සුළු පැමිණිලි වාර්තාවීම් සම්බන්ධයෙන් පවත්වාගෙන යාමට ශ්‍රී ලංකා පොලීසිය සමත්ව තිබේ.

සියළු වර්ග වල අපරාධ විසඳීම් ප්‍රතිශතය ගත් කළ ඉලක්කගත 60% ක ප්‍රතිශතයට සාපේක්ෂව 96% ක විසඳීම් ප්‍රතිශතයක් වාර්තා කිරීමට 2014 වර්ෂයේදී හැකියාව ලැබී තිබේ.

ඒ අනුව බලන කල අපරාධ වාර්තාවීම් හා විසඳීම් පිළිබඳ පහත ප්‍රවණතාවයන් පෙන්නුම් කරනු ලබයි.

i. රට තුළ සිදුවන මුළු අපරාධ ප්‍රමාණය වාර්ෂිකව ක්‍රමයෙන් පහත වැටීම
ii. රට තුළ සිදුවන බල අපරාධ ප්‍රමාණය කැපී පෙනෙන ලෙස අඩුවීම
iii. අපරාධ වාර්තාවීම් වලට සාපේක්ෂව විසඳීම් ක්‍රමයෙන් ඉහළ යාම
iv. සුළු පැමිණිලි විසඳීම සෑම වර්ෂයකම ඉතා ඉහළ අගයක පවත්වාගෙන යාම.

## 4.2 කාන්තාවන්ට හා ළමයින්ට එරෙහිව සිදුවන අපරාධ

අපරාධ හා ප්‍රචණ්ඩත්වයෙන් තොර සමාජයක් නිර්මාණය කිරීමේදී කාන්තාවන්ට හා ළමයින්ට එරෙහිව සිදු වන අපරාධ වැළැක්වීමට හිමි වන්නේ සුවිශේෂී වැදගත්කමකි. ජාතික හා අන්තර්ජාතික වශයෙන් මේ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුවීමද සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා පොලීසිය, අමාත්‍යාංශයේ මඟපෙන්වීම හා මෙහෙයවීම යටතේ අදාළ වෙනත් පාර්ශවයන්ගේද සහය ඇතිව වැඩසටහන් හා ව්‍යාපෘති රාශියක් ක්‍රියාවට නංවන ලදී.

මේ අතර විවිධ ආයතන මඟින් සහ සියළුම පොලිස් ස්ථාන වල පිහිටා ඇති ළමා හා කාන්තා කාර්යාංශ ඒකක මඟින් ළමා අපචාර, ගෘහස්ත හිංසනය, කාන්තා හා ළමයින්ට එරෙහි අපරාධ පිළිබඳව දැනුවත් කිරීම් සිදු කිරීම, විවිධ ක්‍රියාකාරි වැඩසටහන් පැවැත්වීම, වින්දිතයන් ක්‍රමවත්ව පුනරුත්ථාපනය සඳහා යොමු කිරීම, පොලිස් ස්ථාන වල පවතින ළමා හා කාන්තා කාර්යාංශ ඒකක ශක්තිමත් කිරීම ප්‍රධාන වේ.

එහි ප්‍රතිඵල ලෙස අත්පත් කරගත් ප්‍රගතිය පහත සංඛ්‍යා වගුව මඟින් පෙන්නුම් කරනු ලබයි.

**කාන්තාවන්ට හා ළමයින්ට එරෙහි අපරාධ වාර්තා වීම්**

සංඛ්‍යා වගුව **- 02**

| අපරාධ වර්ගය | 2012 | | 2013 | | 2014 | |
|---|---|---|---|---|---|---|
| | වාර්තාවීම් | විසඳීම් | වාර්තාවීම් | විසඳීම් | වාර්තාවීම් | විසඳීම් |
| ළමයින්ට එරෙහි අපරාධ | 6,038 | 1,263 | 6,040 | 2,109 | 5,868 | 1,648 |
| කාන්තාවන්ට එරෙහි අපරාධ | 7,798 | 2,062 | 8,320 | 4,672 | 8,434 | 4,399 |
| එකතුව | **13,836** | **3,325** | **14,360** | **6,781** | **14,302** | **6,047** |

*මූලාශ්‍රය - ශ්‍රී ලංකා පොලීසිය*

පසුගිය වසර තුනක කාල සීමාව සලකා බැලීමේදී ළමා හා කාන්තා අපරාධ වාර්තාවීම් වල සුළු ඉහළ යාමක් පෙන්වන අතර මේ සඳහා කාන්තාවන්ට එරෙහිව සිදුවන අපරාධ වල ඉහළ යාම බලපා ඇති බව පෙනේ.

නමුත් ඊට සාපේක්ෂව 2012 වසරේ 24% ක් වූ විසඳීම් ප්‍රගතිය 2014 වන විට 42% ක් දක්වා ඉහළ නංවා ගැනීමට හැකියාව ලැබී තිබේ. ඒ සඳහා ළමයින්ට එරෙහිව අපරාධ වල 28% ක විසඳීම් ප්‍රගතියක් 52% ක කාන්තාවන්ට එරෙහි අපරාධ වල 52% ක ප්‍රගතියක් ඉවහල් වී ඇත.

## 4.3 රථවාහන අනතුරු

රටේ ජනතාවගේ ජීවිත හා දේපළවල ආරක්ෂාව සැලසෙන පරිදි රථවාහන ගමනාගමනය පාලනය කිරීම නීතිය හා සාමය ආරක්ෂා කිරීමේදී පැවරෙන ප්‍රධාන කාර්යයකි. මේ සඳහා ක්‍රියාත්මක කරනු ලැබූ වැඩසටහන් සහ ව්‍යාපෘති හේතුවෙන් රටේ සමස්ථ වාහන ප්‍රමාණයේ සීඝ්‍ර වර්ධනයක් සිදු වෙමින් පවතින තත්ත්වයක් තුළ වුවද මුළු රථවාහන අනතුරු ප්‍රමාණය ක්‍රමයෙන් අඩුවෙමින් පවතින බව පහත සංඛ්‍යා වගුවෙන් සනාථ වේ.

රථවාහන අනතුරු

සංඛ්‍යා වගුව **- 03**

| වර්ෂය | මාරක අනතුරු | බරපතල අනතුරු | සුළු තුවාල | අලාභ අනතුරු | මුළු අනතුරු | මාරක අනතුරු මරණ සංඛ්‍යාව | වාහන සංඛ්‍යාව | වාහන **1,000**කට අනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|
| **2012** | 2,317 | 7,209 | 14,680 | 17,939 | 42,145 | 2,444 | 4,877,027 | 9 |
| **2013** | 2,190 | 6,870 | 13,525 | 15,292 | 37,877 | 2,324 | 5,203,678 | 7 |
| **2014** | 2,261 | 6,847 | 12,950 | 13,992 | 36,050 | 2,436 | 5,633,234 | 6 |

*මූලාශ්‍රය - ශ්‍රී ලංකා පොලීසිය*

ඉහත වගුව අනුව 2012 වර්ෂයේ 42,145 ක්වූ මුළු රථ වාහන අනතුරු ප්‍රමාණය 2013 වර්ෂය වන විට 37,877 ක් දක්වා ද 2014 වර්ෂය වන විට 36,050 ක් දක්වා ද අඩු වී ඇත. තවද මාරක රිය අනතුරු ප්‍රමාණය මෙන්ම එම නිසා අහිමි වන ජීවිත ප්‍රමාණයේ විශාල අඩු වීමක් පෙන්නුම් කරයි. මාරක රිය අනතුරු නිසා 2012 වර්ෂයේදී මරණ 2,444 ක් සිදු වී ඇති නමුත් 2013 වර්ෂයේදී එය 2,324 දක්වා පහත වැටී ඇති අතර 2014 වර්ෂය අවසන් වන විට අනතුරු නිසා මියගිය ප්‍රමාණය 2,436කි.

ජනගහනයේ වර්ධනයත්, රථවාහන ප්‍රමාණයේ වර්ධනයත් සලකා බලන කල අනතුරු වල පහළ යාම ධනාත්මක අගයක් ගනී. මේ සඳහා අනුගමනය කරන ලද විවිධ වැඩසටහන් සහ නීති රීති හා පාලන ක්‍රමවල සාර්ථකත්වයත්, රථ වාහන පාලනයේ විධිමත්භාවයත් මෙන්ම දියුණු මහා මාර්ග පද්ධතියත් සහ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ දියුණුවත් ඉවහල් වී තිබේ.



*රථවාහන රාජකාරිවල නිරත පොලිස් නිලධාරීන් කණ්ඩායමක්*

## 4.4 සුරාබදු සහ මත්ද්‍රව්‍ය සම්බන්ධ අපරාධ

පොලිස් දෙපාර්තමේන්තුවේ සියළුම ප්‍රාදේශීය කොට්ඨාශ වලත් විශේෂ කාර්ය බලකායේත් මත්ද්‍රව්‍ය නාශක කොට්ඨාශයේත් කැපවීම සහ විමර්ශන වල ප්‍රතිඵලයක් ලෙස නීති විරෝධි මත්පැන් සහ නිද්‍රාජනක ද්‍රව්‍ය සම්බන්ධ වැරදි හෙලිදරව් කරගැනීම පෙර වසරවලට වඩා ඉහළ ප්‍රගතියක් පෙන්නුම් කරයි.

වාර්තා වූ සහ වැටලීම් කළ සුරාබදු වැරදි සහ නිද්‍රා ජනක ද්‍රව්‍ය අත් අඩංගුවට ගැනීම් වල විසඳීම් ප්‍රගතිය ක්‍රමිකව 96% ක ප්‍රතිශතයක් කරා ඉහළ මට්ටමකට ගෙන ඒමට 2014 වර්ෂය තුළ හැකියාව ලැබී තිබේ.

සුරාබදු වැරදි වාර්තාවීම් සහ විසඳීම් ප්‍රගතිය සංඛ්‍යා වගුව - 04 මඟින් දැක්වේ.

**සුරාබදු වැරදි වාර්තාවීම් සහ විසඳීම්**

**සංඛ්‍යා වගුව - 04**

| # | සුරාබදු වැරදි | 2012 | | 2013 | | 2014 | |
|---|---|---|---|---|---|---|---|
| | | වාර්තා වූ | විසඳූ | වාර්තා වූ | විසඳූ | වාර්තා වූ | විසඳූ |
| 1. | නීති විරෝධි මත්පැන් නිෂ්පාදනය කිරීම හෝ පෙරීම | 6,637 | 6,352 | 8,529 | 8,125 | 7,041 | 6,576 |
| 2. | බලපත්‍රයක් නොමැතිව මහ රා නිෂ්පාදන | 58 | 58 | 49 | 48 | 21 | 21 |
| 3. | නීති විරෝධී ලෙස රජයේ අරක්කු නිෂ්පාදනය කිරීම | 104 | 103 | 29 | 25 | 45 | 41 |
| 4. | නීති විරෝධී ලෙස ස්ප්‍රීතු වර්ග නිෂ්පාදනය හෝ පෙරීම | 203 | 193 | 344 | 302 | 712 | 689 |
| 5. | නීති විරෝධි ලෙස මත්පැන් විකිණීම හා ළඟ තබා ගැනීම | 89,966 | 84,781 | 85,655 | 82,436 | 82,042 | 79,386 |
| 6. | නීති විරෝධී මහ රා විකිණීම හා ළඟ තබා ගැනීම | 5,361 | 5,106 | 7,241 | 6,678 | 6,160 | 5,900 |
| 7. | බලපත්‍රයක් නොමැතිව රජයේ අරක්කු විකිණීම හෝ ලීටර් 7.5 ට වඩා ළඟ තබා ගැනීම | 14,710 | 14,164 | 14,354 | 13,692 | 12,358 | 11,421 |
| 8. | බලපත්‍රයක් නොමැතිව බියර් වර්ග හා අනෙකුත් මත් පැන් වර්ග විකිණීම / විකිණීම සඳහා ළඟ තබා ගැනීම | 1,333 | 1,258 | 1,889 | 1,775 | 1,479 | 1,427 |
| 9. | නීති විරෝධි ලෙස නිෂ්පාදනය කළ ස්ප්‍රීතු වර්ග ළඟ තබා ගැනීම හා විකිණීම | 298 | 296 | 487 | 474 | 545 | 540 |
| 10 | නීති විරෝධි මත්පැන් හෝ බලපත්‍රයක් නොමැතිව මහ රා අනෙකුත් ස්ප්‍රීතු වර්ග/රජයේ අරක්කු ප්‍රවාහනය කිරීම (ලීටර් 7.5 ට වැඩි) | 386 | 380 | 351 | 341 | 355 | 336 |
| 11. | නීති විරෝධි මත්පැන්/ස්ප්‍රීතු වර්ග මහ රා නිෂ්පාදනයට ගන්නා උපකරණ ළග තබා ගැනීම | 515 | 489 | 487 | 458 | 351 | 344 |
| 12. | සුරාබදු ආඥා පනත යටතට වැටෙන අනෙකුත් වැරදි | 5,797 | 5,617 | 5,188 | 4,844 | 3,681 | 3,553 |
| | එකතුව | **125,371** | **118,797** | **124,603** | **119,198** | **114,790** | **110,234** |

*මූලාශ්‍රය - ශ්‍රී ලංකා පොලීසිය*

2012 වර්ෂයේ 94% ක් සඳහා වාර්තා වූ සුරාබදු වැරදි වලට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමට හැකියාව ලැබී ඇති අතර පිළිවෙලින් 2013 වර්ෂයේ 95% ක් 2014 වර්ෂයේ 96% ක් දක්වා එය ඉහළ නංවා ගැනීමට සමත් වී ඇත.

පසුගිය කාලපරිච්ඡේදය තුල විශාල වශයෙන් අවධානයට ලක් වුණු නිද්‍රාජනක ද්‍රව්‍ය අත් අඩංගුවට ගැනීම්වලහිද විශාල ප්‍රගතියක් පෙන්වන අතර වාර්තා වූ අපරාධ විසඳීම්වලහිද ඉහළ සාධනයක් පෙන්නුම් කරනු ලබයි.

නිද්‍රාජනක ද්‍රව්‍ය සම්බන්ධ වැරදි වාර්තාවීම් සහ විසදීම් ප්‍රමාණය සංඛ්‍යා වගුව - 05 මඟින් දැක්වේ.

**නිද්‍රාජනක ද්‍රව්‍ය**

**සංඛ්‍යා වගුව - 05**

| # | නිද්‍රාජනක ද්‍රව්‍ය | 2012 | | 2013 | | 2014 | |
|---|---|---|---|---|---|---|---|
| | | වාර්තාවූ | විසඳූ | වාර්තාවූ | විසඳූ | වාර්තාවූ | විසඳූ |
| 1 | ගංජා | 36,384 | 34,970 | 45,921 | 44,651 | 46,884 | 45,997 |
| 2 | අබිං | 5 | 5 | 11 | 10 | 1 | 1 |
| 3 | හෂිස් | 8 | 4 | 10 | 10 | 752 | 660 |
| 4 | හෙරොයින් | 16,886 | 15,283 | 24,400 | 22,966 | 23,578 | 22,041 |
| 5 | මෝෆීන් | 2 | 2 | 12 | 12 | 2 | 2 |
| 6 | කොකේන් | 6 | 0 | 0 | 0 | 4 | 4 |
| 7 | වෙනත් | 2,459 | 2,256 | 3,029 | 3,029 | 3,145 | 3,007 |
| එකතුව | | **56,230** | **52,520** | **73,383** | **70,678** | **74,366** | **71,712** |

*මූලාශ්‍රය - ශ්‍රී ලංකා පොලීසිය*

## 4.5 දූෂණ මර්දන සහ වැටලීම්

ශ්‍රී ලංකා පොලිසියේ ප්‍රාදේශීය ව්‍යුහයේත්, පොලිස් විශේෂ කාර්ය බලකායේත් කැපවීම සහ සහය මත සිදුකරන ලද විමර්ශන සහ වැටලීම් වල ප්‍රතිඵලයක් ලෙස පහත දූෂණ වැරදි සහ ව්‍යවස්ථාපිත වැරදි අනාවරණය කර ගෙන තිබේ.

**දූෂණ හා ව්‍යවස්ථාපිත වැරදි**

**සංඛ්‍යා වගුව- 06**

| # | වරද | 2012 | | 2013 | | 2014 | |
|---|---|---|---|---|---|---|---|
| | | වාර්තා වූ | විසඳූ | වාර්තා වූ | විසඳූ | වාර්තා වූ | විසඳූ |
| 1 | දූෂණ වැරදි (6) | 3,369 | 3,192 | 2,724 | 2,627 | 1,921 | 1,856 |
| 2 | ව්‍යවස්ථාපිත වැරදි (31) | 73,854 | 71,044 | 73,124 | 69,541 | 54,877 | 52,998 |

*මූලාශ්‍රය - ශ්‍රී ලංකා පොලීසිය*

2014 වර්ෂය තුළ සිදු කරන ලද වැටලීම් සහ ලද පැමිණිලි අනුව දූෂණ වැරදි 1,921 ක් වාර්තා වී ඇති අතර ඉන් 97% ක ප්‍රමාණයක් ( 1,856 ) විසඳා අවසන් කිරීමට හැකියාව ලැබී ඇත.

පැමිණිලි, තොරතුරු ලැබීම් අනුව කරන ලද විමර්ශන හා වැටලීම් අනුව ව්‍යවස්ථාපිත වැරදි 54,877 ක් 2014 වර්ෂයේදී අනාවරණය කරගෙන ඇත.

මේ අතර ;

- හොරෙන් විදුලිය ලබා ගැනීම
- සත්ත්ව වධ හිංසා පමුණුවීම
- සුදු ආඥා පනත යටතේ එන වැරදි
- අයාල ආඥා පනත යටතේ එන වැරදි
- පාරිසරක වැරදි
- බීමත්ව කරන ලද වැරදි
- නීති විරෝධි වැලි ගොඩ දැමීම සහ ප්‍රවාහනය කිරීම
- ඩයිනමයිට් යොදා මසුන් මැරිම
- නීති විරෝධි මැණික් ගැරීම යනාදිය ප්‍රධාන වේ.

අපරාධ අනාවරණය කර ගැනීමේදී පොලිස් විශේෂ කාර්ය බලකාය විශේෂ දායකත්වයන් සපයන අතර විශේෂයෙන් වැටලීම් සිදු කිරීම මඟින් නීති විරෝධි දෑ සහ නීති විරෝධි ක්‍රියාවල නිරත වූවන් අත් අඩංගුවට ගැනීමට සහය වේ.

2014 වර්ෂයේ වැටලීම් 601 කට සහ ඒ හා සම්බන්ධ පුද්ගලයන් 1,121ක් දෙනෙකු අත් අඩංගුවට ගැනීමට විශේෂ කාර්ය බලකායේ සහය ලැබී ඇත. සියළුම වැටලීම් වලින් 96% ක් විසඳා අවසන් කර තිබේ.

ඉහත දර්ශක පහම සැලකිල්ලට ගත් විට පොදුවේ රට තුළ නීතිය හා සාමය ස්ථාපිත කිරීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග වල ප්‍රතිඵල ලෙස මහජනයාට ආරක්ෂාකාරී පරිසරයක් තුළ ජීවත් වීමට ඇති ඉඩකඩ වර්ධනය වී ඇත. එම දර්ශක වලින් පිළිබිඹු වන තත්ත්වයන් මේ සම්බන්ධයෙන් අන්තර්ජාතිකව විවිධ ආයතන විසින් පිළියෙල කරනු ලබන දර්ශකයන් මඟින්ද සනාථ කරනු ලබයි.

හමුදාමය කටයුතු, සමාජ සුරක්ෂිතතාව සහ ආරක්ෂාව, අභ්‍යන්තර සහ බාහිර ගැටුම් යන ප්‍රධාන වර්ගීකරණ තුන යටතේ දර්ශක 22 ක් පදනම් කර ගනිමින් සකස් කරනු ලබන ගෝලීය සාම දර්ශකයට අනුව 2014 වර්ෂයේදී රටවල් 162ක් අතුරින් ශ්‍රී ලංකාව 105 වන ස්ථානය හිමිකරගෙන තිබේ.

එම දර්ශකය අනුව 2008 - 2014 කාල සීමාව තුළ ලෝකයේ වේගයෙන්ම සාමය ලඟා කරගනිමින් පවතින රටවල් අතරින් ශ්‍රී ලංකාවට 5 වන ස්ථානය හිමි වී ඇත.

# 05. මූල්‍ය ප්‍රගති සාරාංශය

**2014.12.31** දිනට මූල්‍ය ප්‍රගති සාරාංශය

සංඛ්‍යා වගුව- **07**

**රු.මි.**

| ආයතනය | 2014 වර්ෂයේ සංශෝධිත ප්‍රතිපාදන ප්‍රමාණය | | 2014.12.31 ට මුළු වියදම | | කාර්ය සාධනය (%) | |
|---|---|---|---|---|---|---|
| | පුනරාවර්තන | ප්‍රාග්ධන | පුනරාවර්තන | ප්‍රාග්ධන | පුනරාවර්තන | ප්‍රාග්ධන |
| අමාත්‍යාංශය | 270,500 | 43,010 | 152,406.2 | 31,204.6 | 56.3 | 72.6 |
| විශේෂ කාර්ය බලකාය | 5,612,500 | 6,007,500 | 5,612,500 | 5,844,293 | 100 | 97.3 |
| ශ්‍රී ලංකා පොලීසිය | 43,945,800 | 3,662,425 | 43,584,391 | 3,005,275 | 99.2 | 82 |

*මූලාශ්‍රය - අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා පොලීසිය*



# 06. සංවර්ධන ව්‍යාපෘති වල ප්‍රගතිය

## 6.1 සංවර්ධන ව්‍යාපෘති වල මූල්‍ය ප්‍රගතිය

අමාත්‍යාංශයේ දැක්ම ළඟා කරගැනීමට අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල අරමුණු ඉටුකරගැනීමත් එකී අරමුණු ඉටුකරගැනීමට අවශ්‍ය වාතාවරණය නිර්මාණය කිරීමත් කළ යුතු වේ. මේ අනුව එක් එක් ආයතනයේ සංවර්ධන අවශ්‍යතා සම්පූර්ණ කරමින් මූලික අරමුණු ඉටු කර ගැනීම සඳහා සහය සැපයීමේ ප්‍රධාන ව්‍යාපෘති කිහිපයක් අමාත්‍යාංශයේ මෙහෙයවීම මත ශ්‍රී ලංකා පොලීසියේ සහ විශේෂ කාර්ය බලකායේ වැය විෂය යටතේ ක්‍රියාත්මක කෙරිණි.

**2014.12.31 දිනට සංවර්ධන ව්‍යාපෘති වල ප්‍රගති සාරාංශය**

සංඛ්‍යා වගුව **- 08**

රු.මි.

| # | ව්‍යාපෘතිය | ප්‍රතිපාදන ලැබීම් | වසර තුල මාරු කිරීම් | ශුද්ධ ප්‍රතිපාදනය | 2014.12.31ට වියදම |
|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකා පොලීසිය | | | | | |
| 1 | පෙරසවි නිවාස ව්‍යාපෘතිය | 89 | 435 | 524 | 516 |
| 2 | පොලිස් මූලස්ථානය ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය | 500 | (485) | 15 | 6.6 |
| 3 | ජාතික පොලිස් අභ්‍යාස විද්‍යාලය සංවර්ධනය කිරීම | 750 | (695.4) | 54.6 | 52.4 |
| 4 | පොලිස් නිලධාරීන් සඳහා වන නිවාස යෝජනා ක්‍රමය | 1,500 | (1,489) | 11 | - |
| 5 | පොලිස් තොරතුරු හා සන්නිවේදන පද්ධති ව්‍යාපෘතිය | 575.2 | (570) | 5.2 | 0.2 |
| 6 | පොදු ගොඩනැගිලි ඉදිකිරීම හා සංවර්ධනය | 1,000 | (213) | 787 | 786 |
| උප එකතුව | | **4,414.2** | | **1,396.8** | **1,361.2** |
| විශේෂ කාර්ය බලකාය | | | | | |
| 1 | පෙරසවි නිවාස ව්‍යාපෘතිය | - | 305 | 305 | 303.5 |
| 2 | පොදු ගොඩනැගිලි ඉදිකිරීම හා සංවර්ධනය | 200 | - | 200 | 108.7 |
| උප එකතුව | | **200** | **305** | **505** | **412.2** |
| මුළු එකතුව | | **4,614.2** | | **1,901.8** | **1,773.4** |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා පොලීසිය සහ විශේෂ කාර්ය බලකාය*

## 6.2 සංවර්ධන ව්‍යාපෘති වල භෞතික ප්‍රගතිය

### 6.2.1 ශ්‍රී ලංකා පොලීසිය

- **පෙරසවි නිවාස ව්‍යාපෘතිය**

උතුරු නැගෙනහිර ප්‍රදේශ වල සිවිල් වැසියන් නැවත පදිංචි කිරීමෙන් පසු නීතිය හා සාමය පවත්වාගෙන යාමේ වටපිටාවක් ඇති කිරීමේ දී ඒ සඳහා යොදා ගනු ලබන පොලිස් නිලධාරීන්ට අවශ්‍ය නේවාසික පහසුකම් සැපයීම සුදුසු කඩිනම් ක්‍රමවේදයක් ලෙස පෙරසවි ගොඩනැගිලි ඉදිකිරීම හඳුනා ගන්නා ලදී.

මෙම පෙරසවි ගොඩනැගිලි ඉදිකිරීම අදියර 3 ක් යටතේ ක්‍රියාත්මක කළ අතර මෙහි පළමු අදියරේ කටයුතු සම්පූර්ණයෙන් නිම කර ඇත. එහි සාර්ථකත්වය මත මුල් අදියරේදී උතුරු නැගෙනහිරට පමණක් සීමා වූ ව්‍යාපෘති කටයුතු රටේ අනෙකුත් ප්‍රදේශ වලටද ව්‍යාප්ත කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ නේවාසික පහසුකම් ඇති කිරීමට සමගාමීව නිලධාරීන්ට අවශ්‍ය පානීය ජල පහසුකම් සැපයීම මෙන්ම සනීපාරක්ෂක පහසුකම් සැපයීමද කරන ලදී. මෙකී දෙවන හා තෙවන අදියරේ ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ.

2013 වසරේ ව්‍යාපෘති අදියර II යටතේ පොලිස් කොට්ඨාශ 13 ක් සඳහා ඉදිකරන්නට යෙදුනු ගොඩනැගිලි 175 න් 173ක් සම්පූර්ණයෙන් නිම කර ඇති අතර ඉතිරි ගොඩනැගිලි 02 හි ඉදිකිරීම් සිදුවෙමින් පවතී.

අදිරය III මෙම වසරේ මැද භාගයේ ආරම්භ කළ අතර පොලිස් කොට්ඨාශ 47 ක ගොඩනැගිලි 300 ක් ඉදිකිරීමට නියමිතය. ගොඩනැගිලි 300 න් ගොඩනැගිලි 56 ක ඉදිකිරීම් අවසන් කර ඇති අතර ගොඩනැගිලි 59 ක් ඉදිකරමින් පවතී. 2015 වර්ෂයේදී සියළු ඉදිකිරීම් නිමකිරීමට අපේක්ෂා කෙරේ.

- **පොලිස් මූලස්ථානය ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය**

විසිරී පවතින පොලිස් මූලස්ථානයේ විවිධ අංශ එක් ස්ථානයක ස්ථානගත කිරීමේ අරමුණ ඇතිව මෙම ව්‍යාපෘතිය ආරම්භ කෙරිණ. ව්‍යාපෘති කළමනාකරණ ඒකකය පිහිටුවා ඇති නමුත් මූලස්ථාන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා මුලින් හඳුනාගත් ස්ථානය වෙනස් වීමත්, නව ස්ථානගත කිරීම පිළිබඳ ස්ථිර ප්‍රතිපත්තිමය තීරණයකට එළඹීම ප්‍රමාද වීම නිසාවෙන් ව්‍යාපෘතිය මන්දගාමී ස්වභාවයක් ගන්නා ලදි. කෙසේ වුවද මූලස්ථානය ප්‍රතිස්ථාපනය කිරීම සඳහා ස්ථිර ස්ථානයක් හඳුනාගත් පසු ව්‍යාපෘතිය කඩිනමින් ආරම්භ කිරීම සඳහා සියළු කටයුතු සූදානම් කර ඇත.



- **ජාතික පොලිස් අභ්‍යාස විද්‍යාලය සංවර්ධනය කිරීම**

පොලිස් නිලධාරීන් වෘත්තීයමය වශයෙන් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම යටතේ කටාන පොලිස් අභ්‍යාස විද්‍යාලයේ සහ කළුතර පොලිස් විද්‍යාලයේ සංවර්ධන කටයුතු සිදු කෙරේ. 2014 වර්ෂය සඳහා වෙන් වූ රුපියල් මිලියන 310.3 යටතේ අනු ව්‍යාපෘති 19 ක් ක්‍රියාත්මක කෙරේ. කටාන පොලිස් අභ්‍යාස විද්‍යාලයේ ව්‍යාපෘති 11 ක් සහ කළුතර පොලිස් විද්‍යාලයේ ව්‍යාපෘති 8 ක් වශයෙනි. කටාන පොලිස් අභ්‍යාස විද්‍යාලයේ කෙරෙන ඉදිකිරීම් අතර විද්‍යා පීඨ පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරිම, විද්‍යා පීඨ නවාතැන් ගොඩනැගිල්ල ඉදිකිරිම, අධ්‍යක්ෂ කාර්යාලය සහ නිළ නිවාසය ඉදිකිරීම, කාන්තා නේවාසිකාගාරයක් සහ විවිධ තනතුරු සඳහා නිළ නිවාස ඉදිකිරීම, ක්‍රීඩා මණ්ඩපය සහ අත්පන්දු පැසිපන්දු සඳහා ක්‍රීඩා පිටි ඉදිකිරීම වේ. එක් ව්‍යාපෘතියක් සම්පූර්ණයෙන් අවසන් කර ඇති අතර අනෙකුත් ව්‍යාපෘතිවල කටයුතු 2015 වර්ෂයේදි අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.


- **පොලිස් නිලධාරීන් සඳහා වන නිවාස යෝජනා ක්‍රමය**

2014 අයවැය යෝජනාවක් ලෙස ත්‍රිවිධ හමුදාවට ලබා දෙන සුහසාධන පහසුකම් පොලිස් නිලධාරීන්ටද ලබා දීමේ අරමුණින් නිවාස යෝජනා ක්‍රම 3ක් ඉදිකිරීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවේ. එක් එක් ඉඩමේ නිවාස යෝජනා ක්‍රමය බැගින් නිවාස යෝජනා ක්‍රම තුන ඉදිකිරිමට යෝජිතව ඇත. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා කොළඹට තදාසන්න ප්‍රදේශයකින් සුදුසු ඉඩම් කොටස්පොලිස් දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමේ කටයුතු කෙරෙමින් පවතී.

- **පොලිස් තොරතුරු හා සන්නිවේදන පද්ධති ව්‍යාපෘතිය**

පොලිස් දෙපාර්තමේන්තුවේ තොරතුරු හා සන්නිවේදන පද්ධතිය සංවර්ධනය කරමින් නවීන තොරතුරු තාක්ෂණය දෙපාර්තමේන්තුව සඳහා හඳුන්වා දීමට ක්‍රියාත්මක වන ව්‍යාපෘතියකි.

ව්‍යාපෘතියේ මූලික පියවරයන් අවසන් කර ඇති අතර ලංසු ලේඛන කැඳවීම සඳහා කටයුතු කෙරේ. ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුරට බඳවා ගැනිමේ මූලික කටයුතු අවසන් කර ඇත.



- **ශ්‍රී ලංකා පොලීසියේ ගොඩනැගිලි සංවර්ධනය කිරීම**

පොලිස් දෙපාර්තමේන්තුවේ පොදු යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා පොලිස් ස්ථාන, පොලිස් කාර්යාල, භට නිවාස, පුහුණු මධ්‍යස්ථාන ඇතුළු පොදු ගොඩනැගිලි 84 ක ඉදිකිරීම් මේ වසරේ සැලසුම් කර තිබිණ. ඉන් 52 ක් පොලිස් ස්ථාන වන අතර අනෙකුත් ගොඩනැගිලි 22 කි. එයින් ව්‍යාපෘති 11 ක් සම්පූර්ණයෙන් නිමකර ඇති අතර ව්‍යාපෘති 22 ක ඉදිකිරීම් කරමින් පවතී.

සම්පූර්ණයෙන් වැඩ අවසන් කළ පොලිස් ස්ථාන 8 කි. ඒවානම්;

- බදුල්ල පොලිස් ස්ථානය
- දෙනියාය පොලිස් ස්ථානය
- වලස්මුල්ල පොලිස් ස්ථානය
- දිවුලපිටිය පොලිස් ස්ථානය
- කොච්චිකඩේ පොලිස් ස්ථානය
- අඟුරුවාතොට පොලිස් ස්ථානය
- කටාන පොලිස් ස්ථානය
- නිලාවේලි පොලිස් ස්ථානය



*විවෘත කරන ලද අඟුරුවාතොට පොලිස් ස්ථානය*

## 6.2.2 විශේෂ කාර්ය බලකාය

- **පෙරසවි නිවාස ව්‍යාපෘතිය**

විශේෂ කාර්ය බලකායේ අත්‍යාවශ්‍ය ගොඩනැගිලි අවශ්‍යතාවයට පිළියමක් ලෙසත් පොලිස් දෙපාර්තමේන්තුව සඳහා අවශ්‍ය උපස්ථ ඒකකයක් ලෙස විශේෂ කාර්ය බලකාය දිවයින පුරා යෙදවීමටත් 2014 වර්ෂයේදී පෙරසවි නිවාස ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

මේ යටතේ කඳවුරු 54 ක ගොඩනැගිලි 272 ක් ඉදිකිරීමට අනුමැතිය ලද අතර 2014 වර්ෂය අවසන් වන විට ගොඩනැගිලි 63 ක් ඉදි කිරීම් අවසන් කර ඇත. ගොඩනැගිලි 43 ක ඉදිකිරීම් කෙරෙමින් පවතින අතර 2015 වර්ෂය අවසාන වන විට සියළුම ගොඩනැගිලි ඉදිකිරීම් නිම කිරීමට සැලසුම් කර තිබේ.

- **විශේෂ කාර්ය බලකායේ ගොඩනැගිලි සංවර්ධනය කිරීම**

විශේෂ කාර්ය බලකායේ රටපුරා ව්‍යාප්ත වී ඇති කඳවුරු, පුහුණු මධ්‍යස්ථාන, නිලධාරී කාර්යාල, භට නිවාස ඇතුළු සියළුම යටිතල පහසුකම් වාර්ෂිකව ප්‍රතිසංස්කරණය කිරීම, නව ගොඩනැගිලි ඉදි කිරීම හා සංවර්ධනය කිරීම සිදු කෙරේ.

විශේෂ කාර්ය බලකාය ගොඩනැගිලි ඉදිකිරීම් 19 ක් 2014 වර්ෂයේ සැලසුම් කර තිබූ අතර එයින් ව්‍යාපෘති 13 ක් වර්ෂය අවසාන වන විට සම්පූර්ණයෙන් නිම කර ඇත. අනෙකුත් ඉදිකිරීම් 2015 වර්ෂයේදී නිම කිරීමට සැලසුම් කර තිබේ.





*ඉදිකරමින් පවතින විශේෂ කාර්ය බලකායේ මූලස්ථාන කාර්යාල ගොඩනැගිල්ල*

# 07. කාර්ය මණ්ඩල කාර්ය සාධනය

## 7.1 අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය

**2014.12.31 දිනට අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය**

සංඛ්‍යා වගුව **- 09**

| # | තනතුර | සේවය | පන්තිය | වැටුප් පරිමාණය | සේවා මට්ටම | අනුමත ගණන | | | වර්තමාන සේවක ගණන | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | ස්ථිර | අනියම් | කොන්ත්‍රාත් | ස්ථිර | අනියම් | කොන්ත්‍රාත් |
| 1 | ලේකම් | - | - | SL 4-2006 | 1 | 1 | - | - | 1 | - | - |
| 2 | අතිරේක ලේකම් | ශ්‍රී.ලං.ප.සේ | Sp | SL 3-2006 | 1 | 1 | - | - | 1 | - | - |
| 3 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේ | I | SL 1-2006 | 1 | 2 | - | - | 2 | - | - |
| 4 | ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේ | I | SL 1-2006 | 1 | 1 | - | - | 1 | - | - |
| 5 | ගණකාධිකාරී (අභ්‍යන්තර විගණන) | ශ්‍රී.ලං.ග.සේ | II/III | SL 1-2006 | 1 | 1 | - | - | - | - | - |
| 6 | සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේ | III | SL 1-2006 | 1 | 3 | - | - | 2 | - | - |
| 7 | අධ්‍යක්ෂ (සැලසුම්) | ශ්‍රී.ලං.ක්‍ර.සේ | I | SL 1-2006 | 1 | 1 | - | - | 1 | - | - |
| 8 | සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) | ශ්‍රී.ලං.ක්‍ර.සේ | II/III | SL 1-2006 | 1 | 1 | - | - | 1 | - | - |
| 9 | ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේ | II/III | SL 1-2006 | 1 | 1 | - | - | 1 | - | - |
| 10 | පරිපාලන නිලධාරී | රා.ක.ස | Supra | MN 7-2006 A | 3 | 1 | - | - | - | - | 1 |
| 11 | භාෂා පරිවර්තක ( සිංහල-දෙමළ) | භා.ප.සේ | Spe, I | MN 6-2006A | 3 | 1 | - | - | - | - | - |
| 12 | භාෂා පරිවර්තක ( සිංහල- ඉංග්‍රීසි) | භා.ප.සේ | Spe, I | MN 6-2006A | 3 | 1 | - | - | - | - | - |
| 13 | සම්බන්ධීකරණ ලේකම් - ලේකම් | අනියම් | - | - | 3 | 1 | - | - | 1 | - | - |
| 14 | තොරතුරු සන්නිවේදන තාක්ෂණික නිලධාරී | තො.ස.තා.සේ | Class II Grade II | MN 6-2006A | 3 | 1 | - | - | - | - | - |
| 15 | සංවර්ධන නිලධාරී | සං.නි.සේ | III,II,I | MN 4-2006 A | 2 | 14 | - | - | 13 | - | - |
| 16 | රාජ්‍ය කළමනාකරණ සහකාර | රා.ක.ස.සේ | III,II,I | MN 2-2006 A | 2 | 30 | - | - | 21 | - | - |
| 17 | රියදුරු | රි.සේ | III,II,I | PL3-2006 | 1 | 12 | - | - | 7 | - | - |
| 18 | කාර්යාල කාර්ය සහයක | කා.කා.ස.සේ | III,II,I, Spe | PL1-2006 | 1 | 13 | - | - | 7 | - | - |
| එකතුව | | | | | 30 | 86 | - | - | 59 | - | 1 |

*මූලාශ්‍රය : අමාත්‍යාංශයේ පාලන අංශය*

## 7.2 2014 වර්ෂය තුළ අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයේ වෙනස්වීම්

**2014.01.01 සිට 2014.12.31 දිනට කාර්යය මණ්ඩල වෙනස්වීම්**

සංඛ්‍යා වගුව - 10

| # | තනතුර | සේවය | අනුමත සේවක සංඛ්‍යාව | නව අනුමත කිරීම් | ස්ථාන මාරු වී ගිය නිලධාරීන් ගණන | විශ්‍රාම ගිය නිලධාරීන් ගණන | මුල් පත්වීම් ලැබ පැමිණි නිලධාරීන් ගණන | ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන් ගණන |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | ජ්‍යෝෂ්ඨ සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේ | **2** | **-** | **-** | **-** | **-** | **1** |
| 2 | සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේ | **3** | **-** | **1** | **-** | **-** | **1** |
| 3 | සංවර්ධන නිළධාරී | සං.නි.සේ | **14** | **-** | **-** | **-** | **-** | **8** |
| 4 | රාජ්‍ය කළමණාකරන සහකාර | රා.ක.ස.සේ. | **30** | **-** | **1** | **-** | **19** | **2** |
| 5 | කාර්යාල කාර්ය සහයක | කා.කා.සේ | **13** | **4** | **-** | **-** | **-** | **-** |
| 6 | රියදුරු | රි.සේ. | **12** | **3** | **-** | **-** | **-** | **3** |
| **එකතුව** | | | | **7** | **2** | **-** | **19** | **15** |

*මූලාශ්‍රය : අමාත්‍යාංශයේ පාලන අංශය*

අමාත්‍යාංශය පිහිටුවිමෙන් අනතුරුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබූ කාර්යය මණ්ඩල අවශ්‍යතා අනුව තනතුරු වර්ග 18 කට අදාළව කාර්යය මණ්ඩලය 79 දෙනෙකු සඳහා අනුමැතිය ලබා ගන්නා ලදි. තවද 2014 වර්ෂයේ කාර්යාල කාර්යය සහයක තනතුර සඳහා නිළධාරින් 4 දෙනෙක් සහ රියදුරු තනතුර සඳහා නිළධාරින් 3 දෙනෙක් සඳහා කාර්යය මණ්ඩල අවශ්‍යතාවය මත සේවක සංඛ්‍යාව අනුමත කර ගන්නා ලදී. ඒ අනුව අනුමත මුළු කාර්යය මණ්ඩලය 2014.12.31 දිනට 86 කි. එම අනුමැතිය අනුව අදාළ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සම්බන්ධීකරණය කරමින් මේ වන විට කාර්යය මණ්ඩල සාමාජිකයින් 60 දෙනෙකු බඳවා ගැනීම හා අනුයුක්ත කර ගැනීම සම්පූර්ණ කර ඇත. ඒ අනුව 2014 වර්ෂය අවසාන වන විට අවශ්‍යතාවයෙන් 70% ක් සම්පූර්ණ කර ගෙන තිබේ.

## 7.3 අමාත්‍යාංශ කාර්යය මණ්ඩලයේ දේශිය හා විදේශිය පුහුණු කිරීම්

අමාත්‍යාංශයේ කාර්යය මණ්ඩල සංයුතිය විවිධ අමාත්‍යාංශ, දෙපාර්තුමේන්තු වල සේවය කළ නිලධාරීන්ගෙන් මෙන්ම බහුතරයක් නවක කළමනාකරණ සේවයේ හා සංවර්ධන නිලධාරීන්ගෙන් සමන්විත වූවකි. එබැවින් අමාත්‍යාංශයේ පොදු දැක්ම ළඟා කර ගැනිමට හැකිවන පරිදි ආකල්ප කුසලතා හා නිපුණතා සංවර්ධනයට පුහුණුවීම් ලබා දීම අත්‍යවශ්‍ය කරුණක් විය.

අමාත්‍යාංශ නිලධාරීන්ගේ ආකල්ප කුසලතා හා නිපුණතා සංවර් ධනයසඳහා ධනාත්මක චින්තනය නායකත්ව හා කුසලතා සංවර්ධනය සඳහා තෙදිනක නේවාසික වැඩමුළුවක් පේරාදෙණිය නිල්ලඹ සමෘද්ධි පුහුණු ග්‍රාම සංවර්ධන මධ්‍යස්ථානයේදි සංවිධානය කළ අතර ඒ සඳහා ලේකම්වරයා ඇතුළු නිලධාරීන් 60 ක් සම්බන්ධ විය.

තවද 'Skills Development Fund Ltd.' ආයතනය මගින් පවත්වනු ලැබූ බඳවා ගැනීම් පටිපාටිය සම්බන්ධ පුහුණු වැඩමුළුව සඳහා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් 02 ක් ද රාජ්‍ය ලේඛන පරිපාලනය හා ලේඛනාරාක්ෂක නීතිය පිළිබඳව වැඩමුළුව සඳහා සංවර්ධන නිලධාරියෙකු ද සහභාගී විය.

දේශිය පුහුණු වලට අමතරව අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරීන් කීප දෙනෙකු සඳහා විදේශිය පුහුණු කීපයකට ද සහභාගී වීමට අවස්ථාව සලසා දෙන ලදී.

දේශිය හා විදේශීය වශයෙන් නිලධාරීන් පුහුණු වැඩසටහන් වලට සම්බන්ධ වීම අමාත්‍යාංශ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට බෙහෙවින් ඉවහල් වන බව පෙනී යයි.




*අමාත්‍යාංශ නිලධාරීන්ගේ තෙදින බැහැරගත පුහුණු වැඩසටහන*



***සම්පත් දායකයා දේශනයක් කරමින්***

## 7.4 ශ්‍රී ලංකා පොලිසියේ සහ විශේෂ කාර්ය බලකායේ කාර්ය මණ්ඩලය
## 7.4.1 විශේෂ කාර්ය බලකායේ කාර්ය මණ්ඩලය

**2014.12.31 දිනට විශේෂ කාර්ය බලකායේ කාර්ය මණ්ඩලය**

සංඛ්‍යා වගුව **- 11**

| # | තනතුර | අනුමත තනතුරු සංඛ්‍යාව | | සේවයේ නියුතු සංඛ්‍යාව | | පුරප්පාඩු සංඛ්‍යාව | | අතිරික්ත සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | පිරිමි | කාන්තා | පිරිමි | කාන්තා | පිරිමි | කාන්තා | පිරිමි | කාන්තා |
| 1 | නියෝජ්‍ය පොලිස්පති | 1 | - | - | - | 1 | - | - | - |
| 2 | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී | 8 | - | 6 | - | 2 | - | - | - |
| 3 | පොලිස් අධිකාරී | 7 | - | - | - | 7 | - | - | - |
| 4 | සහකාර පොලිස් අධිකාරී | 31 | - | 23 | - | 8 | - | - | - |
| 5 | ප්‍රධාන පොලිස් පරීක්ෂක | 67 | 2 | 66 | 2 | 1 | - | - | - |
| 6 | පොලිස් පරීක්ෂක | 270 | 7 | 113 | 5 | 157 | 2 | - | - |
| 7 | උප පොලිස් පරීක්ෂක | 812 | 13 | 606 | 3 | 206 | 10 | - | - |
| 8 | උප පොලිස් පරීක්ෂක (ප්‍රවාහන) | 4 | - | - | - | 4 | - | - | - |
| 9 | මහ සැරයන් | 37 | - | 28 | - | 9 | - | - | - |
| 10 | පොලිස් සැරයන් | 1,625 | 27 | 710 | 12 | 915 | 15 | - | - |
| 11 | පොලිස් කොස්තාපල් | 6,499 | 139 | 5,860 | 145 | 639 | - | - | 6 |
| 12 | මහ සැරයන් රියදුරු | 8 | - | 2 | - | 6 | - | - | - |
| 13 | පොලිස් සැරයන් රියදුරු | 64 | - | 38 | - | 26 | - | - | - |
| 14 | පොලිස් කොස්තාපල් රියදුරු | 577 | - | 516 | - | 61 | - | - | - |
| එකතුව | | **10,010** | **188** | **7,968** | **167** | **2,042** | **27** | **-** | **6** |

*මූලාශ්‍රය : විශේෂ කාර්ය බලකාය*

## 7.4.2 ශ්‍රී ලංකා පොලීසියේ කාර්ය මණ්ඩලය

**2014.12.31 දිනට ශ්‍රී ලංකා පොලීසියේ කාර්ය මණ්ඩලය**

සංඛ්‍යා වගුව **- 12**

| තනතුර | අනුමත තනතුරු සංඛ්‍යාව | | සේවයේ නියුතු සංඛ්‍යාව | | පුරප්පාඩු සංඛ්‍යාව | | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| | පිරිමි | කාන්තා | පිරිමි | කාන්තා | පිරිමි | කාන්තා | |
| පොලිස්පති | 01 | - | 01 | - | - | - | - |
| ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති | 11 | - | 10 | - | 01 | - | - |
| නියෝජ්‍ය පොලිස්පති | 37 | - | 28 | - | 09 | - | - |
| ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී | 114 | 01 | 90 | - | 24 | 01 | - |
| පොලිස් අධිකාරී | 153 | 02 | 28 | - | 125 | 02 | - |
| සහකාර පොලිස් අධිකාරී | 294 | 10 | 316 | 10 | - | - | 16 |
| සහකාර පොලිස් අධිකාරී (වෘත්තීය) | 18 | 02 | - | - | 18 | 02 | - |
| අධ්‍යක්ෂ සංගීත | 01 | - | - | - | 01 | - | - |
| ප්‍රධාන පොලිස් පරීක්ෂක | 780 | 15 | 625 | 15 | 155 | - | - |
| පොලිස් පරීක්ෂක | 2,699 | 266 | 2,368 | 234 | 331 | 32 | - |
| පොලිස් පරීක්ෂක (වැඩ ඒකක) | 05 | - | - | - | 05 | - | - |
| පොලිස් පරීක්ෂක (වාද්‍ය) | 04 | - | 01 | 02 | 03 | - | - |
| පොලිස් පරීක්ෂක (වාද්‍ය හේවිසි) | 02 | - | - | - | 02 | - | - |
| පොලිස් පරීක්ෂක (ගුවන් විදුලි) | 01 | - | - | - | 01 | - | - |
| පොලිස් පරීක්ෂක (කාර්මික) | - | - | 02 | - | - | - | - |
| පොලිස් පරීක්ෂක (ප්‍රවාහන) | - | - | 01 | - | - | - | - |
| උප පොලිස් පරීක්ෂක | 5,112 | 610 | 3,803 | 491 | 1,374 | 119 | - |
| උප පොලිස් පරීක්ෂක (වැඩ ඒකක) | 05 | - | - | - | 05 | - | - |
| උප පොලිස් පරීක්ෂක (වාදක) | - | 03 | 11 | 03 | - | - | - |
| උප පොලිස් පරීක්ෂක (හේවිසි වාදක) | - | - | 01 | - | - | - | - |
| උප පොලිස් පරීක්ෂක (ගුවන් විදුලි) | 14 | - | - | - | 14 | - | - |
| උප පොලිස් පරීක්ෂක (කාර්මික) | 09 | - | 09 | - | - | - | - |
| උප පොලිස් පරීක්ෂක (ප්‍රවාහන) | 125 | - | 49 | - | 76 | - | - |
| උප පොලිස් පරීක්ෂක (වෘත්තීය) | 186 | 90 | - | - | 186 | 90 | - |
| මහ සැරයන් | 100 | - | 03 | - | 97 | - | - |
| මහ සැරයන් (කාර්මික) | 02 | - | - | - | 02 | - | - |
| මහ සැරයන් (ප්‍රවාහන) | 50 | - | 13 | - | 37 | - | - |
| මහ සැරයන් (වාදක) | 03 | - | - | - | 03 | - | - |
| පොලිස් සැරයන් | 15,315 | 1,800 | 14,825 | 1,328 | 490 | 472 | - |
| පොලිස් සැරයන් (කාර්මික) | 56 | - | 88 | - | - | - | 32 |
| පොලිස් සැරයන් (වාදක) | 57 | 10 | 35 | 01 | 22 | 09 | - |
| පොලිස් සැරයන් (ගුවන් විදුලි) | 10 | - | - | - | 10 | - | - |
| පොලිස් සැරයන් රියදුරු | 700 | - | 509 | - | 191 | - | - |
| පොලිස් කොස්තාපල් | 41,824 | 8,268 | 40,248 | 5,566 | 1,576 | 2,702 | - |
| පොලිස් කොස්තාපල් (කාර්මික) | 273 | - | 214 | - | 59 | - | - |
| පොලිස් කොස්තාපල් (වාදක) | 170 | 30 | 194 | 12 | - | 18 | 24 |
| පොලිස් කොස්තාපල් (රේඩියෝ) | 50 | - | 26 | - | 24 | - | - |
| පොලිස් කොස්තාපල් (රියදුරු) | 3,500 | - | 3,200 | - | 300 | - | - |
| පොලිස් කොස්තාපල් (වෘත්තීය) | 5,181 | 199 | - | - | 5,181 | 199 | - |
| එකතුව | **76,862** | **11,306** | **66,698** | **7,662** | **10,322** | **3,648** | **72** |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා පොලීසිය*

## 7.5 ශ්‍රී ලංකා පොලීසිය සහ විශේෂ කාර්ය බලකායේ බඳවා ගැනීම් සහ උසස්වීම්

අමාත්‍යාංශය පිහිටුවීමෙන් පසු ආරම්භ කළ ප්‍රධානතම කාර්යයන් අතුරින් එකක් වනුයේ ශ්‍රී ලංකා පොලීසියේ සහ විශේෂ කාර්ය බලකායේ පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කිරීමට පියවර ගැනීමයි. කාලයක් තිස්සේ විවිධ හේතු නිසා උසස් කිරීම් පටිපාටීන් වල සිදුවී තිබූ ප්‍රමාද දෝෂ නිසා අතෘප්තියට පත්ව සිටි නිලධාරීන් තෘප්තිමත් සේවක පිරිසක් බවට පත් කිරීම මෙහි මූලික අරමුණ විය. ඒ අනුව එක් එක් තනතුරෙහි අවශ්‍යතාවය මත නවක නිළධාරීන් බඳවා ගැනීමත් උසස්වීම් සඳහා සුදුසුකම් ලැබ තිබූ නිලධාරීන් උසස් කිරීමත් කරනු ලැබිණි. පොලිස් දෙපාර්තමේන්තුව තුළ තෘප්තිමත් සේවක පිරිසක් බිහි කිරීමෙන් දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය ඉහළ නැංවීමට මෙය ඉවහල් විය.

ඒ යටතේ පහතින් ඉදිරිපත් කර ඇති පරිදි 2014 වර්ෂය තුළ එක් එක් තනතුරු සඳහා නව බඳවා ගැනීම් සහ උසස්වීම් ලබා දෙන ලදී.

**ශ්‍රී ලංකා පොලීසියේ සහ විශේෂ කාර්ය බලකායේ නව බඳවා ගැනීම්**

**සංඛ්‍යා වගුව - 13**

| අනු අංකය | තනතුර | බඳවා ගත් ප්‍රමාණය |
|---|---|---|
| 01 | සහකාර පොලිස් අධිකාරී | 03 |
| 02 | උප පොලිස් පරීක්ෂක | 213 |
| 03 | පොලිස් කොස්තාපල් | 1,370 |
| 04 | පොලිස් කොස්තාපල්/විශේෂ කාර්ය බලකාය | 570 |
| 05 | කාන්තා පොලිස් කොස්තාපල් | 308 |
| 06 | කාන්තා පොලිස් කොස්තාපල්/ විශේෂ කාර්ය බලකාය | 53 |
| 07 | පොලිස් කොස්තාපල් රියදුරු | 798 |
| 08 | පොලිස් කොස්තාපල් රියදුරු/ විශේෂ කාර්ය බලකාය | 70 |
| එකතුව | | **3,385** |

***මූලාශ්‍රය : ශ්‍රී ලංකා පොලීසිය සහ විශේෂ කාර්ය බලකාය***

**ශ්‍රී ලංකා පොලීසියේ සහ විශේෂ කාර්ය බලකායේ උසස්වීම්**

**සංඛ්‍යා සටහන - 14**

| අනු අංකය | තනතුර | උසස් කළ ප්‍රමාණය |
|---|---|---|
| 01 | පොලිස් අධිකාරී සිට ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී දක්වා | 16 |
| 02 | සහකාර පොලිස් අධිකාරී සිට පොලිස් අධිකාරී දක්වා | 05 |
| 03 | ප්‍රධාන පොලිස් පරීක්ෂක සිට සහකාර පොලිස් අධිකාරී දක්වා | 124 |
| 04 | ප්‍රධාන පොලිස් පරීක්ෂක සිට සහකාර පොලිස් අධිකාරී දක්වා/වි.කා.බ | 15 |
| 05 | පොලිස් පරීක්ෂක සිට ප්‍රධාන පොලිස් පරීක්ෂක දක්වා | 260 |
| එකතුව | | **405** |

***මූලාශ්‍රය : ශ්‍රී ලංකා පොලීසිය සහ විශේෂ කාර්ය බලකාය***

## 7.6 ශ්‍රී ලංකා පොලීසියේ සහ විශේෂ කාර්ය බලකායේ දේශීය හා විදේශීය පුහුණු කිරීම්

පොලිස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සිය රාජකාරී සඳහා පුහුණු කිරීම් ප්‍රධාන වශයෙන් කළුතර පොලිස් විද්‍යාලය සහ කටාන ජාතික පොලිස් අභ්‍යාස ආයතනය මූලික කොට ගෙන කරනු ලබයි. ඊට අමතරව සේවාස්ථ පුහුණු ආයතන, කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය, වෙනත් රාජ්‍ය විශ්ව විද්‍යාල සහ පුහුණු ආයතන සඳහා සහ විදේශ පුහුණු වැඩසටහන් සඳහා ද නිලධාරීන් යොමු කරමින් පුහුණුවීම් ලබා දෙනු ලැබේ. එක් එක් ආයතන මට්ටමින් 2014 වර්ෂය තුළ විෂයානුගත සහ රාජකාරී පිළිබඳ සිද්ධාන්ත පාඨමාලා පුහුණු ලබාදීම් පිළිබඳ විස්තර සංඛ්‍යා වගුව - 15 මඟින් දැක්වේ.

**ශ්‍රී ලංකා පොලීසියේ පුහුණු වීම් - ආයතන මට්ටමින්**

**සංඛ්‍යා වගුව - 15**

| අනු අංකය | පැවැත් වූ ආයතන | සහභාගී වූ නිලධාරීන් | | | | |
|---|---|---|---|---|---|---|
| | | රාජ්‍ය නිවේදිත නිලධාරීන් | පරීක්ෂක ශ්‍රේණියේ නිලධාරීන් | කණිෂ්ඨ ශ්‍රේණියේ නිලධාරීන් | වෙනත් | එකතුව |
| 01 | ජාතික පොලිස් අභ්‍යාස ආයතනය | 216 | 1,072 | 59 | - | 1,347 |
| 02 | ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලය | 03 | 511 | 1,816 | - | 2,330 |
| 03 | ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය | 01 | 19 | 02 | - | 22 |
| 04 | සේවාස්ථ පුහුණු ආයතන | 16 | 1,721 | 25,597 | - | 27,334 |
| 05 | වෙනත් විශ්ව විද්‍යාල හා පුහුණු ආයතන | 63 | 863 | 232 | 14 | 1,172 |
| එකතුව | | **299** | **4,186** | **27,706** | **14** | **32,205** |

***මූලාශ්‍රය : පොලිස් දෙපාර්තමේන්තුව***

ශ්‍රී ලංකා පොලීසියේ දේශීය පුහුණුවීම් ලබාදුන් නිලධාරී පිරිස අතර මහජන හිතකාමී සේවාවක් ලබාදීමේ අපේක්ෂාවෙන් ප්‍රජා පොලිස්කරණය පිළිබඳව පුහුණු පාඨමාලාව හැදෑරූ නිලධාරීන්ද, ආචාර ධර්ම පිළිබඳව පුහුණු පාඨමාලාව හැදෑරූ නිලධාරීන් ද, ආයතන කළමනාකරණය පිළිබඳව පුහුණු පාඨමාලාව හැදෑරූ නිලධාරීන්ද වේ. නිලධාරීන්ගේ භාෂා දැනුම වැඩි දියුණු කිරීමේ අරමුණින් දෙමළ භාෂාව පිළිබඳව නිළධාරීන් 1,200 කටද, ඉංග්‍රීසි භාෂාව පිළිබඳව නිළධාරීන් 800 කටද පුහුණුව ලබාදී ඇත. පොලිස් නිලධාරීන්ගේ දැනුම අන්තර්ජාතික ක්‍රමවේදයන් වලින් සන්නද්ධ කිරීමේ අරමුණින් විවිධ නිළයන්ට අයත් වන නිලධාරීන් 155ක් රටවල් 79 ක් වෙත යවා විදේශීය පුහුණුවීම් ලබා දී ඇත.

**විශේෂ කාර්ය බලකාය මෙහෙයවන ලද පුහුණු වීම්**

සංඛ්‍යා වගුව - 16

| අනු අංකය | විස්තරය | පාඨමාලා ගණන | නිලධාරීන් ගණන |
|---|---|---|---|
| 01 | වි.කා.බ නිලධාරින් සඳහා පවත්වන ලද පුහුණු පාඨමාලා ගණන | 41 | 4,264 |
| 02 | වෙනත් ආයතන වල නිලධාරීන් සඳහා පුහුණු පාඨමාලා ගණන | 27 | 1,852 |
| | එකතුව | 68 | 6,116 |

*මූලාශ්‍රය :* **විශේෂ කාර්ය බලකාය**

2014 වර්ෂය තුළදී විශේෂ කාර්ය බලකා නිලධාරීන් 14,264ක් දේශීය පුහුණු වීම් තුලින් සන්නද්ධ කර ඇත. විදේශීය දැනුම නිලධාරීන් සඳහා ලබා දීමේ අරමුණින් විශේෂ කාර්ය බලකායේ නිලධාරීන් 08 දෙනෙකු රටවල් 05 වෙත යවා විදේශ පුහුණුවීම් ලබාදීමට කටයුතු කර ඇත. විශේෂ කාර්ය බලකාය විසින් වෙනත් ආයතනවල නිලධාරින් පුහුණු කිරීම යටතේ මාලදිවයින් පොලිස් නිලධාරින්ට ද, ශ්‍රී ලංකා පොලිස් නිලධාරින්, නාවික හමුදා නිලධාරින්, ගුවන් හමුදා නිලධාරින්, බන්ධනාගාර නිලධාරින්ට ද, පුහුණු පාඨමාලා පැවැත්වීම සිදු කර තිබේ.



*පුහුණුව ලබා පිටවයන නිලධාරීන් පිරිසක්*

## 08. ආයතනිකමය ව්‍යුහය සංවර්ධනය

ආයතනයක සංවිධාන ව්‍යුහයත් එහි කාර්යයන්, වගකීම් බලතල බෙදී ගොස් ඇති ආකාරයත් එකී ආයතනයේ සාර්ථකත්වය කෙරෙහි මූලිකවම බලපාන කරුණක් වේ. ආයතනයක් සතුව පවතින තාක්ෂණික ක්‍රමවේදයන් ද එහි කාර්යයන් හී සාර්ථකත්වයට බලපාන සෘජු සාධකයකි. මේ අනුව මෙම අමාත්‍යාංශයේත්, අමාත්‍යාංශය යටතේ අධීක්ෂණය වන පොලිස් දෙපාර්තමේන්තුව සහ විශේෂ කාර්ය බලකායේත් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනිම සඳහා පවතින ආයතනිකමය ව්‍යුහය, සම්පත් සහ ක්‍රමවේදයන් තවදුරටත් ශක්තිමත් කිරීම අඛණ්ඩව සිදු කරමින් පවතින අතර පසුගිය කාල සීමාව තුළ මේ සම්බන්ධයෙන් පහත කාර්යයන් කරන ලදී.

### 8.1 නීතිය හා සාමය පිළිබඳ උපදේශක සභාවක් ස්ථාපිත කිරීම

අමාත්‍යාංශයේ විෂය පථය ආවරණය වන පරිදි ප්‍රතිපත්ති හා සැලසුම් සම්පාදනය කිරීමට අවශ්‍ය ක්ෂේත්‍රයේ නිපුණතාවයක් සහිත පුද්ගලයින්ගේ විශේෂඥ දැනුම ලබා ගැනීමේ අරමුණින්අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ උපදේශක සභාවක් ස්ථාපිත කිරීම සඳහා 2014.05.29 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදී. එමඟින් ප්‍රතිපත්ති හා සැලසුම්, වඩාත් ඵලදායී ලෙස සම්පාදනය කර ක්‍රියාත්මක කිරීම සඳහා දායකත්වය ලබාගැනීමට අවකාශ ලැබේ.

### 8.2 අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණ කමිටුවක් ස්ථාපිත කිරීම

අමාත්‍යාංශයේත්, ශ්‍රී ලංකා පොලීසියේත්, විශේෂ කාර්ය බලකායේත් ප්‍රතිපත්ති සහ වැඩසටහන් අනෙකුත් ආයතන හා අමාත්‍යාංශ වල ක්‍රියාකාරී දායකත්වය සමග වඩාත් ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීම මෙම කමිටුව ස්ථාපිත කිරීමේ මූලික අරමුණ වේ. මේ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2014.05.29 දින ලැබී ඇති අතර ආයතන 18 ක සහභාගීත්වය ලබා ගැනීමට අපේක්ෂා කෙරේ. මෙමඟින් අනෙකුත් අමාත්‍යාංශ සහ ආයතන වල කාර්යයන් මත රඳා පවතින අප අමාත්‍යාංශයේ කටයුතු එක් එක් ආයතන අතර මනා සම්බන්ධතාවයක් ඇති කිරීම තුලින් කඩිනම් කිරීමට අපේක්ෂා කෙරේ. මෙම සම්බන්ධීකරණය අමාත්‍යාංශයේ මෙන්ම මේ සමඟ සම්බන්ධ වන අනෙකුත් සෑම ආයතනයකම කාර්යසාධනයද ඉහළ නැංවීමට හේතු වනු ඇත. එක් එක් ආයතන සමඟ අප අමාත්‍යාංශය යටතේ පවතින ආයතන සම්බන්ධීකරණය වන අවස්ථා සහ එම අවස්ථාවලදී පැන නඟින ගැටළු හඳුනාගනිමින් පොලිස් දෙපාර්තමේන්තුව සමඟ මූලික සාකච්ඡා පවත්වනු ලැබිණ.

### 8.3 පොලිස් දෙපාර්තමේන්තුව සඳහා ඉංජිනේරු ඒකකයක් පිහිටුවීම

පොලිස් දෙපාර්තමේන්තුව සිය ඉදිකිරීම් අවශ්‍යතා මධ්‍යගත ක්‍රියාකාරීත්වයෙන් යුතු අඩු සංඛ්‍යාවක නිලධාරීන්ගෙන් සමන්විත ඉංජිනේරු ඒකකයක මෙහෙයවීමෙන් සිදු කෙරේ. ඉදිකිරීම් අවශ්‍යතා විශාල ප්‍රමාණයක් පැවතියද ප්‍රතිපාදන විශාල ප්‍රමාණයක් පොලිස් දෙපාර්තමේන්තුව සඳහා වෙන් වුනද සිවිල් ඉංජිනේරු නිර්මාණ කටයුතු සහ ඉදිකිරීම් මන්දගාමී ස්වභාවයක් ගෙන තිබීම නිසා පොලිස් දෙපාර්තමේන්තුව සඳහා විධිමත් ව්‍යුහයකින් යුතු ඉංජිනේරු ඒකකයක අවශ්‍යතාවය දැඩිසේ මතුව තිබේ. ඒ අනුව නව ඉංජිනේරු ඒකකයක් පිහිටුවීම සඳහා මූලික පියවර ගෙන ඇත.

## 8.4 ආගමික කටයුතු පිළිබඳ පැමිණිලි විසඳීම සඳහා නව පොලිස් අංශයක් ස්ථාපිත කිරීම

2014.04.28 වන දින බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශ පරිශ්‍රයේ ආගමික කටයුතු සම්බන්ධයෙන් වන පැමිණිලි විසඳීම සඳහා වෙනම පොලිස් ඒකකයක් ස්ථාපිත කරන ලදී. මෙම ඒකකය මඟින් පැමිණිලි ලබා ගැනිම සඳහා වෙනම දුරකථන අංකයක් (011 5979 999 / 011 3071 059) හඳුන්වා දීම ද සිදු කරනු ලැබිණ.

## 8.5 නව පොලිස් ස්ථාන, මුරපොල ස්ථාපිත කිරීම

පොලිස් ස්ථානයක අවශ්‍යතාවය පවතින ප්‍රදේශ හඳුනා ගනිමින් නව පොලිස් ස්ථාන හා මුරපොලවල් ඉදි කිරීම තුළින් සියළුම ප්‍රදේශ ආවරණය වන පරිදි සාමකාමී වාතාවරණයක් රට තුළ ඇති කිරීමට කටයුතු කෙරේ. මේ යටතේ 2014 වර්ෂයේ නව පොලිස් ස්ථාන තුනක අවශ්‍යතාවය හඳුනාගෙන තිබේ. ඒවා නම්;

- වීරවිල පොලිස් ස්ථානය
- පින්නවල පොලිස් ස්ථානය
- කටාන පොලිස් ස්ථානය

ඉන් කටාන පොලිස් ස්ථානයේ ඉදි කිරීම් 2014 වර්ෂයේ සම්පූර්ණයෙන් අවසන් කර ඇති අතර ඉතිරි පොලිස් ස්ථාන දෙකෙහි ඉදිකිරීම් 2015 වර්ෂයේසිදු කිරීමට නියමිතය.

## 8.6 වෙනත් රටවල් සමඟ එළැඹි ගිවිසුම්

ශ්‍රී ලංකා පොලිස් සේවය හා ජාත්‍යන්තර පොලිස් සේවා අතර සහයෝගීතාවය වර්ධනය කර ගනිමින් ජාතික සීමාවන් ඉක්ම වූ අපරාධ මර්ධනය සහ අපරාධකරුවන් හඳුනා ගැනීමත් නීතියේ රැහැනට හසු කර ගැනීමත් පොලිස් නිලධාරීන්ගේ පුහුණු අවස්ථා ඉහළ නැංවීම සඳහා පුහුණු පාඨමාලා හුවමාරු කර ගැනීමත් අරමුණු කර ගනිමින් රටවල් කිහිපයක පොලිස් සේවා සමඟ අවබෝධතා ගිවිසුම් වලට එළඹෙන ලදී.

ඒ යටතේ අවබෝධතා ගිවිසුම් මාලදිවයින් පොලිස් සේවය සමඟත් වියට්නාම පොලිස් සේවය සමඟත් අත්සන් තබන ලදී. රුසියාව, තුර්කිය, ඉන්දුනීසියාව, දකුණු අප්‍රිකාව සහ උගන්ඩාව යන රටවල් වල පොලිස් සේවාවන් සමඟ සහයෝගීතාවය වර්ධනය කර ගැනීම සඳහා ගිවිසුම් සකස් කරමින් පවතී. තවද විශේෂ කාර්ය බලකාය සඳහා 9x9mm උණ්ඩ ලබාගැනීම සඳහා චීනය සමඟ ගිවිසුමකට එළඹ ඇත. ශ්‍රී ලංකා පොලිස් සේවය ජාත්‍යන්තර පොලිස් සේවාවන් හි සම කිරීමට මෙම ගිවිසුම් ඉවහල් වෙනු ඇත.

## 8.7 නිලධාරීන් සඳහා නව නිළ ඇඳුම් හඳුන්වා දීම

පොලිස් දෙපාර්තමේන්තුවේ කාන්තා නිලධාරීන්ගේ නිළ ඇඳුම ඔවුන්ගේ රාජකාරී කටයුතු වලට පහසු වන පරිදිත් විදේශ පොලිස් සේවාවල කාන්තා නිලධාරිනියන්ගේ ඇඳුමට සමාන වන පරිදිත් දැනට භාවිතා වන සාය සහ කමිසය සමඟ දිග කලිසම සමඟ අත් කොට කමිසයකින් යුතු නිළ ඇඳුමක් හඳුන්වා දෙනු ලැබීය.

මෙතෙක් සේවයේ නියුතු ගර්භණී කාන්තා නිලධාරිනියන්ට පොදු නිළ ඇඳුමක් නොතිබීමේ අඩුව සම්පූර්ණ කරමින් ඔවුනටද පිනපෝ ගවුමක් හඳුන්වා දීමට කටයුතු කරන ලදී. එසේම ජනාධිපති ආරක්ෂක කොට්ඨාශයේ නිලධාරීන් හඳුනා ගැනීමේ පහසුව පිණිස ඔවුනටද නව නිළ ඇඳුමක් හඳුන්වා දීමට කටයුතු කර ඇත.

## 8.8 පොලිස් මූලස්ථානය සහ පොලිස් ස්ථාන අතර සන්නිවේදන ක්‍රමවේදය ශක්තිමත් කිරීම

Virtual Private Network (VPN) තාක්ෂණය මඟින් පොලිස් මූලස්ථානය වෙත ලබාදෙන පණිවිඩ එසැණින් ප්‍රාදේශීය නිලධාරීන්ට ලබාදීමේ සන්නිවේදන ජාලය තවදුරටත් ශක්තිමත් කරන ලදී. මෙමඟින් පොලිස් දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවෙන අතර පොලිස් මූලස්ථාන පරිපාලන ක්‍රියාදාමය විධිමත් වනු ඇත.

## 8.9 නව පාපැදි, යතුරු පැදි, මෝටර් රථ සහ රාජකාරි සඳහා අවශ්‍ය උපකරණ ලබා දීම

පොලිස් නිලධාරීන්ගේ සේවය පහසු කිරීමටත් කාර්යක්ෂම කිරීමටත් නිලධාරීන්ගේ ගමන් පහසුව පිණිස වාහන සහ රාජකාරී උපකරණ ලබා දීම සිදු කෙරේ.

මේ යටතේ රථ වාහන කොට්ඨාශය ඇතුළු අනෙකුත් කොට්ඨාශ වල නිළධාරීන්ගේ මුර සංචාර සඳහා සහ පොලිස් ස්ථාන වලට හදිසි අවස්ථා වලදී ඉක්මනින් ළඟා වියයුතු ස්ථාන කරා ළඟා වීමේ අවශ්‍යතාවය සඳහා 600cc එන්ජින් ධාරිතාවයකින් යුතු යතුරු පැදි 315 ක් සහ 125cc එන්ජින් ධාරිතාවයකින් යුතු යතුරු පැදි 1,000 ක් පොලිස් දෙපාර්තමේන්තුව වෙත ලබා දෙන ලදී.

පොලිස් නිලධාරීන් ලබාදෙන සේවය කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා පණිවිඩ හුවමාරු කිරීම වේගවත් කිරීමේ අටියෙන් සහ එහිදී වැයවන පිරිවැය අවම කිරීමේ අරමුණින් දෙපාර්තමේන්තුවේ සෑම ප්‍රාදේශීය කොට්ඨාශයක්ම ආවරණය වන පරිදි ජංගම දුරකථන 1,000 ක් ලබා දෙන ලදී.

තවද ලෑන්ඩ් කෲෂර් රථ 60ක්, ලෑන්ඩ් රෝවර් රථ 60 ක්, මෝටර් රථ 64 ක්, ජල ප්‍රහාරක රථ 10 ක්, මිනි බස් 05ක් සහ පා පැදි 15ක් රාජකාරී අවශ්‍යතාවය සඳහා සැපයීම සිදු කර ඇත.



*පොලිස් නිලධාරීන් වෙත බෙදා දුන් **600CC** එන්ජින් ධාරිතාවයකින් යුතු යතුරු පැදි*

# 09. නෛතික ප්‍රතිපාදන සවිබල ගැන්වීම

ආයතනයක් පිහිටුවීමත්, එකී ආයතනයට පැවරෙන කාර්යයන් නිශ්චිත කිරීමත්, එකී කාර්යයන් ඉටු කිරීමේදී කටයුතු කළ යුතු ආකාරයත් නීතිමය පදනම යටතේ ආවරණය කෙරේ. මෙම නෛතික තත්ත්වයන් අවශ්‍යතාවය මත කලින් කලට යාවත්කාලීන කිරීම කාර්යසාධනයේ කාර්යක්ෂමතාවයට සහ ඵලදායීතාවයට වැදගත් වේ.

## 9.1 පොලිස් ආඥා පණත සංශෝධනය කිරීම

1865 අංක 16 දරණ පොලිස් ආඥා පණත පොලිස් දෙපාර්තමේන්තුව සහ එහි කාර්යයන් මෙහෙයවන මූලික නෛතිකමය ලියවිල්ල වේ. මෙම පණත 1984 වර්ෂයේදී සංශෝධනය වූ පසු මේ දක්වා නැවත සංශෝධනයට ලක්වී නොමැත. වෙනස් වූ ජීවන රටාවන් හා ආර්ථික සමාජයීය හා දේශපාලනික තත්ත්වයන් යටතේ පොලිස් දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරීත්වය ශක්තිමත් කිරීම සඳහා පණත සංශෝධනය කිරීම කාලීන අවශ්‍යතාවයක් බවට පත්ව තිබේ. ඒ අනුව වර්තමාන හා අනාගත සමාජයීය හා තාක්ෂණික සංවර්ධන අවශ්‍යතාවයන්ට ගැළපෙන අයුරින් යාවත්කාලීන කර පනත සංශෝධනය කිරීම සඳහා 2014.11.19 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබේ. මේ යටතේ නීතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිපාදන ශක්තිමත් කිරිමටත්, පොලිස් නිලධාරීන්ගේ ආකල්ප වර්ධනය කිරිමටත් පහත අයුරින් සංශෝධන හඳුන්වා දී තිබේ.

i. සයිබර් අපරාධ මර්දනය
ii. රථ වාහන අනතුරු අවම කිරීම
iii. සාමය කඩවන හෝ කඩවීමට අත්‍යාසන්න අවස්ථා පාලනය
iv. ප්‍රජා පොලිස් සංකල්පය ක්‍රියාත්මක කිරීම
v. නීතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන් වැළැක්වීම
vi. පොලිස් දෙපාර්තමේන්තුව මානුෂීයවාදී, යහපත් ආක්ලප වලින් හෙබි පොලිස් බලකායක් බවට පත් කිරීම
vii. පොලිස් නිලධාරීන්ගේ චිත්ත ධෛර්ය වර්ධනය සහ ස්වයං අභිප්‍රේරණය ඉහළ දැමීම
viii. පුහුණු සහ සංවර්ධනය තුළින් නිලධාරීන්ගේ නිපුණතාවය වර්ධනය කිරීම
ix. වඩාත් හොඳින් පොලිස් කර්තව්‍ය ඉටු කරන විදේශ පොලිස් සේවයන් සමඟ සබඳතා ගොඩ නඟා ගැනීම
x. නීතිය හා සාමය පවත්වාගෙන යාම සඳහා නව තාක්ෂණ ක්‍රමවේද භාවිතය ඉහළ නැංවීම
xi. පොලිස් නිලධාරීන්ගේ රාජකාරී ජීවිතයට වන තර්ජන - අවදානම- ආරක්ෂණය
xii. පොලිස් නිලධාරීන්ට එරෙහි විනය ක්‍රියාමාර්ග කඩිනම් කිරීම
xiii. නිලධාරීන්ට එරෙහි පැමිණිලි විභාග කිරීම සඳහා වන ඒකකයක් අමාත්‍යාංශය තුළ ස්ථාපිත කිරීම
xiv. ස්ථාවර වත්කම් අත්පත් කරගැනීම සඳහා වන බලය නිශ්වය කිරීම
xv. විවිධ මාර්ග වලින් පොලීසියට ලැබෙන තොරතුරු මත ක්‍රියාකිරීමට ඇති බලය නිශ්වය කිරීම
xvi. විවිධ අණ පණත් වලින් පොලීසියට පැවරී ඇති බලතල තහවුරු කිරීම

## 9.2 ස්වයංක්‍රීය ඇඟිලි සලකුණු හඳුනාගැනීමේ ක්‍රමයක් ස්ථාපිත කිරීම

අපරාධකරුවන්ගේ ඇඟිලි සලකුණු ස්වයංක්‍රීයව හඳුනාගැනීමේ ක්‍රමවේදය නිළ වශයෙන් හඳුන්වාදීම 2014 දැයට කිරුළ සංවර්ධන ප්‍රදර්ශනයේදී සිදුකරන ලදී. මේ මඟින් අපරාධකරුවන් නීතියේ රැහැනට හසුකරගැනීම වේගවත් කිරීම තුලින් අපරාධ විසඳීමේ වේගය වැඩි කිරීමට අපේක්ෂා කෙරේ.

## 9.3 ස්වයංක්‍රීය දඩපත් ගෙවීමේ ක්‍රමයක් ස්ථාපිත කිරීම

දඩ මුදල් අයකර ගැනීම වේගවත් කිරීමත් රාජ්‍ය ආදායමට එකතුවන දඩ මුදල් ප්‍රමාණය ඉහළ නැංවීමත් මහජනයාට දඩ මුදල් ගෙවීම පහසු කිරීමත් අරමුණින් රථවාහන වැරදි සඳහා ස්වයංක්‍රීයව දඩ මුදල් ගෙවීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම සඳහා සැලසුම් කරමින් පවතී. මෙතුළින් පොලිස් දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට අපේක්ෂා කරන අතර රාජ්‍ය පෞද්ගලික සහයෝගීතාවය තුලින් සමාජීය අරමුණු ඉටුකර ගැනීම සිදු වේ. මෙම වර්ෂයේදී ඒ සඳහා යොදා ගන්නා තාක්ෂණික ක්‍රමවේදයන් පිළිබඳව තීරණය කිරීමේ සාකච්ඡාවට ගණනාවක් පවත්වන ලදී.

## 10. වෙනත් විශේෂ කාර්යයන්

### 10 .1 මහජන දුක්ගැනවිලි කළමනාකරණය කිරීමේ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම

මහජන පැමිණිලි, යෝජනා, චෝදනා, දුක්ගැනවිලි කළමනාකරණය කිරීම සඳහා අමාත්‍යාංශයත් පොලිස් දෙපාර්තමේන්තුවත් ක්‍රමවේදයන් කිහිපයක් අනුගමනය කරනු ලැබේ. මේ යටතේ අමාත්‍යාංශය මඟින් 118 දුරකථන අංකය ඔස්සේ පැමිණිලි ලබා ගන්නා අතර පොලිස් දෙපාර්තමේන්තුව මඟින් 119 දුරකථන අංකය ඔස්සේ හදිසි ඇමතුම් සේවාවක් ක්‍රියාත්මක කෙරේ. 118 හා 119 හදිසි ඇමතුම් සේවාවන්ට ලැබුණු පැමිණිලි සහ ඒවා විසඳීමේ ප්‍රගතිය පහත වගු මඟින් දැක්වේ.

**118 හදිසි ඇමතුම් සේවාව**

**සංඛ්‍යා වගුව -17**

| වර්ෂය | පැමිණිලි වර්ගය | | | | | | | විසඳුම් ලබා දුන් ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|---|---|
| | අපරාධ | රථ වාහන | දූෂණ | සුළු ආරවුල් | පවුල් ආරවුල් | වෙනත් | එකතුව | |
| 2012 | 2,181 | 3,478 | 11,521 | 9,016 | 1,225 | 5,857 | **33,278** | **29,781** |
| 2013 | 2,367 | 4,106 | 13,458 | 15,166 | 1,648 | 5,570 | **42,315** | **38,196** |
| 2014 | 2,344 | 3,760 | 12,011 | 10,046 | 1,341 | 6,410 | **35,912** | **33,811** |

***මූලාශ්‍රය : 118 හදිසි ඇමතුම් ඒකකය***

118 හදිසි ඇමතුම් සේවාවට ලැබුණු පැමිණිලි වලින් 2012, 2013 සහ 2014 වර්ෂ වල විසඳීමේ ප්‍රගතිය පිළිවෙලින් 89%, 90% සහ 94% ලෙස වේ. ඒ අනුව118 පැමිණිලි විසඳීමේ ක්‍රමික වර්ධනයක් දැකියහැකි වේ.

**119 හදිසි ඇමතුම් සේවාව**

**සංඛ්‍යා වගුව - 18**

| වර්ෂය | පැමිණිලි වර්ගය | | | | | | | විසඳුම් ලබා දුන් ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|---|---|
| | අපරාධ | රථ වාහන | දූෂණ | සුළු පැමිණිලි | පවුල් ආරවුල් | වෙනත් | එකතුව | |
| 2013 | 52,113 | 65,114 | 140,540 | 291,924 | 38,777 | 87,801 | **676,269** | **665,900** |
| 2014 | 65,886 | 69,180 | 178,546 | 330,243 | 47,921 | 106,698 | **798,474** | **793,457** |

**මූලාශ්‍රය : 119 හදිසි ඇමතුම් ඒකකය**

119 හදිසි ඇමතුම් සේවාවේ 2013 සහ 2014 වර්ෂ වල ලැබුණු පැමිණිලි විසඳීම පිළිවෙලින් 98% සහ 99%ක ඉහළ අගයක් වාර්තා කරනු ලබයි.

පොලිස්පතිට කියන්න සහ පොලිස්පති සහන මැදිරිය මේ හා සමගාමීව සෘජුවම පොලිස්පති මැදිහත් වීමකින් යුතුව පොලිස්පති වෙත ඉදිරිපත් වෙන ගැටළු විසඳීමට ක්‍රියාත්මක වන සේවාවන් වේ. මෙම සේවාවන් සඳහා 2014 වර්ෂය තුල පැමිණිලි 1,450 ලැබී ඇති අතර එයින් 1,309 විමර්ශනය කර සහන සලසා ඇත. තවත් පැමිණිලි 141 විමර්ශනය වෙමින් පවතී.

## 10.2 ප්‍රජා පොලිස් සේවාව ක්‍රියාත්මක කිරීම

2008 ඔක්තොබර් මස 11 වන දින ප්‍රජා පොලිස් සංකල්පය ආරම්භය සනිටුහන් කරයි. නීතිගරුක පුරවැසියන් අපරාධ මැඩලීමේ කියාවලිය සඳහා සහභාගී කර ගනිමින් අපරාධ වැළැක්වීම සඳහා ප්‍රජා පොලිස් නිලධාරින් මෙහෙය වනු ලැබේ. ප්‍රජා පොලිස් කමිටු ග්‍රාමසේවා වසම් මට්ටමින්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින්, දිස්ත්‍රික්ක මට්ටමින් හා ජාතික මට්ටමින් පිහිටුවා ඇත. 2014 වර්ෂයේ පිහිටවූ සහ රැස්වූ කමිටු පිළිබඳ තොරතුරු සංඛ්‍යා වගුව - 19 මඟින් දැක්වේ.

**ප්‍රජා පොලිස් සිවිල් ආරක්ෂක කමිටු සහ රැස්වීම්**

සංඛ්‍යා වගුව **- 19**

| අනු අංකය | සිවිල් ආරක්ෂක කමිටු | පිහිට වූ කමිටු ගණන | පැවැත් වූ කමිටු ගණන |
|---|---|---|---|
| 01 | දිස්ත්‍රික් කමිටු ගණන | 24 | 97 |
| 02 | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ කමිටු ගණන | 331 | 3,401 |
| 03 | උපදේශක කමිටු ගණන | 429 | 4,924 |
| 04 | ග්‍රාමීය සිවිල් ආරක්ෂක කමිටු ගණන | 14,046 | 306,222 |
| 05 | පොලිස් ස්ථාන (මව්) කමිටු ගණන | 429 | 4,905 |
| **එකතුව** | | **15,259** | **319,549** |

*මූලාශ්‍රය : පොලිස් දෙපාර්තමේන්තුව*

සිවිල් ආරක්ෂක කමිටු මඟින් ප්‍රජා පොලිස් සේවාවෙහි නියුතු නිලධාරීන් සිදු කරන ලද දැනුවත් කිරිම් සහ වෙනත් වැඩසටහන් පිළිබඳ තොරතුරු සංඛ්‍යා වගුව - 20 මඟින් දැක්වේ. ඒ අනුව ප්‍රජා පොලිස් කමිටු මඟින් 2014 වර්ෂයේ වැඩසටහන් 524,270 ක් ක්‍රියාත්මක කර තිබේ.

**ප්‍රජා පොලිස් සිවිල් ආරක්ෂක කමිටු වල කාර්යයන්**

සංඛ්‍යා වගුව **- 20**

| අනු අංකය | විස්තරය | ගණන |
|---|---|---|
| 01 | ප්‍රජා පොලිස් සේවාවන් මඟින් පාසල් දරුවන් දැනුවත් කිරීමේ දේශන | 19,369 |
| 02 | ප්‍රජා වෘත්තිය පුහුණු සඳහා මාර්ගෝපදේශන වැඩසටහන් | 3,091 |
| 03 | ප්‍රජා වෘත්තිය පුහුණු සඳහා පාසල් වෑන් රථ රියදුරන් දැනුවත් කිරීම | 9,977 |
| 04 | ප්‍රජා පොලිස් සේවාවන් මඟින් පාසල් දරුවන් සඳහා විවිධ ක්‍රීඩා තරඟ පැවැත්වීම. | 3,107 |
| 05 | අපරාධ/ළමා හිංසන/කාන්තා හිංසන/රථ වාහන/මත්ද්‍රව්‍ය ආදිය | 186,189 |
| 06 | ඩෙංගු ඇතුළු බෝවන රෝග පිළිබඳ දැනුවත් කිරීම | 156,089 |
| 07 | ළමා හිංසන/ළමා අපචාර/නායකත්ව ආදිය | 19,369 |
| 08 | පාසල් හැරගිය දරුවන් දැනුවත් කිරීම් | 3,091 |
| 09 | පාසල් වෑන් රථ රියදුරන්/සහයකයින් දැනුවත් කිරීම | 9,977 |
| 10 | බස් රථ/ත්‍රිවිල්/ලොරි හා අනෙකුත් වාහන රියදුරන් දැනුවත් කිරීම් | 26,312 |
| 11 | මත්ද්‍රව්‍ය හා මත්පැන් දුරු කිරීම සඳහා දැනුවත් කිරීම | 30,858 |
| 12 | වෙනත් දැනුවත් කිරීම් | 61,351 |
| **එකතුව** | | **524,270** |


*මූලාශ්‍රය : පොලිස් දෙපාර්තමේන්තුව*

ප්‍රජා පොලිස් සංකල්පය තුළින් අපරාධ පාලනය සඳහා 2014 වර්ෂයේ පොලිස් ජංගම සේවා 1,739 ක් ද පවත්වා ඇත.

## 10 .3 දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන

2007 වර්ෂයේ සිට වසරක් පාසා පවත්වනු ලබන දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන සඳහා අමාත්‍යාංශය ද ඒ යටතේ ඇති අනෙකුත් ආයතනයන් ද සහභාගී විය. මෙහිදී දැයට කිරුළෙන් දායාද කෙරෙන සංවර්ධනයෙහි ප්‍රතිඵල වල හිමිකාරීත්වය සංවර්ධනයෙහි නියම උරුමකරුවන් වන ග්‍රාමීය ජනතාවට ලබා දීමට අප ද ක්‍රියා කළේය. එහිදී පොලිස් ප්‍රදර්ශන කලාපයට ලැබුනු අක්කර දෙකක භූමි ප්‍රමාණය සංවර්ධනය කර "සෙවන උද්‍යානය" නමින් විශ්ව විද්‍යාල ශිෂ්‍ය ප්‍රජාවට දායාද කරන ලදී.

එමෙන්ම 8 වන දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන යටතේ අමාත්‍යාංශයේ අධීක්ෂණයෙන් විශේෂ කාර්ය බලකාය 6 වන ස්ථානය දිනා ගන්නා ලදී.



*අමාත්‍යාංශය මඟින් දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන යටතේ විශ්ව විද්‍යාල ශිෂ්‍ය ප්‍රජාවට ප්‍රදානය කළ "සෙවන උද්‍යානය"*

# 11. ප්‍රගති සාරාංශය

2014 වර්ෂයේ මුල් කාර්තු තුන තුළ නීතිය හා සාමය රට තුළ ස්ථාපිත කිරීමේ අරමුණ ඉටුකර ගැනීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග වල යහපත් වර්ධනය අපරාධ වාර්තා සහ විසඳීම් ප්‍රතිශතයන් නිරීක්ෂණයේදී පෙනී යයි. 2014 වර්ෂය අවසාන වන විට මධ්‍යකාලීන වියදම් රාමුව තුල වාර්ෂික ඉලක්ක ලඟා කර ගැනීමේ අපේක්ෂිත කාර්යසාධන මට්ටම කරා ගමන් කිරීමට ඇති හැකියාව එයින් පෙන්නුම් කෙරේ.

කෙසේ වෙතත් භෞතික යටිතල පහසුකම් සපුරා ගැනීම සඳහා ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය සැලසුම් කළ කාර්යසාධන මට්ටමට වඩා පහළ ප්‍රගතියක් සටහන් කරන ලදී.

මෙම පසුබෑම සඳහා පහත හේතු බලපා ඇති බව පෙනේ.

i. සැලසුම් සකස් කිරීමේ සහ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා වැඩි කාලයක් ගත වීම.
ii. අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන ඒකකයේ මානව සම්පත් අවශ්‍යතාවය නිසි පරිදි නොලැබීම.
iii. පොලිස් දෙපාර්තමේන්තුවේ ඉදිකිරීම් මෙහෙයවීම සඳහා පවතින ආයතනික ව්‍යුහය ශක්තිමත් බවින් අඩු වීම.
iv. ව්‍යාපෘති බොහොමයක් ආරම්භක අවධියේ පැවතීම නිසා සිදු වූ ප්‍රමාදයන්.
v. වෙනත් බාහිර නොවැලැක්විය හැකි හේතූන්.

නීතිය හා සාමය ස්ථාපිත කිරීමට අදාලව පසුගිය වසරකට ආසන්න කාල සීමාව තුළ අමාත්‍යාංශයේ ක්‍රියාකාරීත්වය තුළින් ලබාගත් අත්දැකීම් සහ කාර්ය සාධනය පදනම් කර ගනිමින් ඉලක්ක ලඟා කර ගැනීම සඳහා යාවත්කාලීන කළ උපායමාර්ග සමඟ ඉදිරි තෙවසර සඳහා වූ මධ්‍යකාලීන ආයෝජන සැලසුම සම්පාදනය කරනු ලැබ ඇත. මෙහිදී පහත සඳහන් අවශ්‍යතා ප්‍රමුඛතා ලෙස හඳුනා ගෙන තිබේ.

i. ආරම්භ කළ ව්‍යාපෘති අවසන් කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීම.
ii. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා නව යාන්ත්‍රනයක් ස්ථාපිත කිරීම සහ පවත්නා යාන්ත්‍රනය කාර්යක්ෂම කිරීම.
iii. මානව සම්පත් ඌනතා සපුරාලීම සහ පවත්නා මානව සම්පත සානුබල ගැන්වීම.
iv. පවත්නා තොරතුරු සන්නිවේදන පද්ධතිය කාර්යක්ෂම කිරීමට නූතන තාක්ෂණික මෙවලම් භාවිතය.
v. අල්ලස් හා දූෂණය අවම කිරීම සඳහා නූතන තාක්ෂණික කළමනාකරණ ක්‍රම හඳුන්වා දීම.